ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

இலங்கை திரிபோஷ கம்பனி

Sri Lanka Thriposha Ltd.

ත්‍රිපෝෂ
THRIPOSHA
திரிபோஷ
A SRI LANKA FORTIFIED FOOD PROGRAMME OF THE MINISTRY OF HEALTHCARE & NUTRITION

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
Annual Report

2023

පටුන

පසුබිම 01

ඉතිහාසය 02

අපගේ දැක්ම 04

අපගේ මෙහෙවර 04

විස්තීර්ණ විශ්ලේෂණය 05

වටිනාකම් සහ යොමුගත ක්ෂේත්‍ර 06

ඉලක්ක 07

සභාපතිතුමාගේ පණිවිඩය 09

සංවිධාන ව්‍යුහය 10

අධ්‍යක්ෂ මණ්ඩලය 11

සාංගමික කළමණාකාරිත්වය 13

සමස්ථ නිෂ්පාදනය පිළිබඳ තොරතුරු 15

ත්‍රිපෝෂ බෙදාහැරීමේ තොරතුරු 16

සාරාංශගත විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම කරුණු 19

අවදානම් කළමනාකරණය 20

ප්‍රධාන කාර්යසාධන දර්ශක 23

තිරසාර සංවර්ධන ඉලක්ක 24

උපායමාර්ග 25

ඇමුණුම්

★ පාර්ශවකාර විශ්ලේෂණය 27

★ 'ශදුඅත' විශ්ලේෂණය 29

★ පෝටර්ගේ පංච මහා බලවේග 30

ස්තුතිය 31

විගණිත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 32

විගණකාධිපති වාර්තාව 61

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ("SLTL" හෝ "සමාගම" යනුවෙන් හඳුන්වනු ලබන) ආයතනය, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ රාජ්‍ය ව්‍යවසායයක් ලෙස 2010 වර්ෂයේ දී ස්ථාපිත කරන ලද්දේ ය. “ශ්‍රී ලංකාවේ මන්දපෝෂණය තුරන් කිරීමේ” ප්‍රධාන අරමුණ මුදුන් පමුණුවා ගැනීම සඳහා පිහිටුවන ලද මෙම ආයතනය ආරම්භයේ දී හඳුන්වා දෙන ලද්දේ “ත්‍රිපෝෂ වැඩසටහන” යනුවෙනි. ත්‍රිපෝෂ වැඩසටහන 1973 වසරේ දී ආරම්භ කරන ලද්දේ, ඇමරිකා එක්සත් ජනපදයේ පිහිටි “කෙයා” (“CARE”) නමැති මානුෂීය සංවිධානයේ සහාය ඇතිව ය. ආරම්භයේ දී, මෙම අධි ආහාර අතිරේකය ඇමරිකා එක්සත් ජනපදයෙන් ආනයනය කර ඉලක්කගත ප්‍රතිලාභීන් වෙත බෙදා හැරීමට පෙර ශ්‍රී ලංකාවේ ඇසුරුම් කරන ලදී. ආරම්භක අවස්ථාවේ සිට මේ දක්වා ත්‍රිපෝෂවල ප්‍රධාන අමුද්‍රව්‍ය වනුයේ බඩඉරිඟු, සෝයා සහ කිරිපිටි යන නිෂ්පාදනයන් ය.

සෞඛ්‍ය අමාත්‍යාංශය මෙම වැඩසටහන උදෙසා සිය සහයෝගය 1976 වර්ෂයේ සිට ලබා දුන් අතර, එහි කළමනාකාරිත්වය පවත්වා ගෙන යාම සඳහා ටෙන්ඩර් කැඳවුම් ක්‍රියාවලියක් හරහා ලංකා දුම්කොළ සමාගම (“CTC”) තෝරා ගන්නා ලදී. 2010 වසරේ දී මෙම වැඩසටහන ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් (SLTL) නමින් පූර්ණ වශයෙන්ම රජයට අයත් සමාගමක් බවට පත් කර සෞඛ්‍ය අමාත්‍යාංශයේ විෂය පථය යටතට භාර කරන ලදී. 2016 වසරේ දී එක්ස්ට්‍රෑඩර් යන්ත්‍ර (Extruder) ප්‍රතිස්ථාපනය කිරීමෙන් උත්පාදනය වූ අතිරික්ත නිපැයුම් ධාරිතාව හේතුවෙන්, වර්ෂ 2017 දී ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම විසින් “සුපෝෂ” ("Suposha") නමින් සන්නාමගත තම වාණිජ නිෂ්පාදනය වෙළඳපොළ වෙත දියත් කර හඳුන්වා දීමට ඊට හැකි විය.

වසර 2020 දී ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ආයතනයේ රේඛීය අමාත්‍යාංශය ලෙස කාන්තා සහ ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය යටතට අනුයුක්ත කෙරිණි. පසුව 2023/05/30 දින ගැසට් පත්‍ර අංක 2334/07 මගින් ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සාමාගමෙහි රේඛිය අමාත්‍යාංශය ලෙස මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතට අනුයුක්ත කරන ලදි.

1973

ත්‍රිපෝෂ වැඩසටහන, ඇමරිකා එක්සත් ජනපදයේ පිහිටි "කෙයා" ("CARE") නමැති මානුෂීය සංවිධානයේ සහාය ඇතිව ආරම්භ කෙරිණි. ආරම්භයේ දී, මෙම අධි ආහාර අතිරේකය ඇමරිකා එක්සත් ජනපදයෙන් ආනයනය කර "අයිසීඑස්එම්" (ICSM) පිටි යොදා ගනිමින් ශ්‍රී ලංකාවේ දී ඇසුරුම් කරන ලදී.

1976

මෙම වැඩසටහන සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහයෝගය හිමි විය. වැඩසටහනේ කළමනාකාරිත්වය "කෙයා" සංවිධානයේ විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයට පවරා දෙන ලදී.

1979

ත්‍රිපෝෂ වැඩසටහන කළමනාකරණය කිරීම පිණිස සුදුසු සමාගමක් තෝරා ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් ටෙන්ඩර් කැඳවන ලද අතර, අමාත්‍යාංශය, "කෙයා" සංවිධානය සහ ලංකා දුම්කොළ සමාගම අතර ත්‍රෛපාර්ශ්වික ගිවිසුමක් අත්සන් කිරීමෙන් පසු ලංකා දුම්කොළ සමාගම වෙත ත්‍රිපෝෂ වැඩසටහනෙහි කළමනාකරණය ප්‍රදානය කරන ලදී.

1980

බ්‍රේඩි වර්ගයේ යන්ත්‍ර දෙකක් හඳුන්වා දෙමින් ජාඇල කර්මාන්ත ශාලාවේ ත්‍රිපෝෂ නිෂ්පාදනය ආරම්භ කෙරිණි. නිෂ්පාදනය සඳහා භාවිතා කරන ලද වට්ටෝරුව වූයේ, ඉරිඟු-සෝයා මිශ්‍රණය (CSB) සහ ICSM පිටි සමන්විත සංයෝගයකි.

1987

"කෙයා" සංවිධානය ත්‍රිපෝෂ වැඩසටහනෙන් සම්පූර්ණයෙන්ම ඉවත් විය.

2010

ත්‍රිපෝෂ වැඩසටහන සමාගම් පනත යටතේ "ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්" (SLTL) ලෙස පූර්ණ වශයෙන් රජය සතු සමාගමක් බවට පත් කර, එම වැඩසටහන කළමනාකරණය කළ ලංකා දුම්කොළ සමාගම වෙතින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ විෂය පථය යටතට එය පවරා ගනු ලැබිණි.

2016

බ්‍රේඩි එක්ස්ට්‍රෑඩර් ("Braidy" Extruder) යන්ත්‍රය වෙනුවට ඇන්ඩසර්න් ("Anderson") යන්ත්‍රයක් භාවිතා කරන ලද අතර එමඟින් ත්‍රිපෝෂ සඳහා වන සම්පූර්ණ ඉල්ලුම සපුරාලීමට ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමට හැකි විය.

2017

නිෂ්පාදනයේ පැවති අතිරික්තය හේතුවෙන් "සුපෝෂ" නමින් වාණිජ නිෂ්පාදනයක් වෙළඳපොළට හඳුන්වා දෙන ලද්දේ ය.

2023

නියුට්‍රි බාර් වගර්යේ පෝෂක ආහාරයක් වාණිජ නිෂ්පාදනයක් ලෙස "සුපෝෂ කැලරි බාර්" නමින් දේශීය වෙළඳපොළට හඳුන්වා දෙන ලදී.

සුපෝෂ කැලරි බාර් එකක් අමුද්‍රව්‍ය කිහිපයකින් සමන්විත වන අතර ඒවායින් වඩාත් ජනප්‍රිය ආහාර ද්‍රව්‍ය වන්නේ බඩ ඉරිඟු, සෝයා (සුපෝෂ කුඩු), බටර්, කිරිපිටි, බිත්තර, සීනි, විටමින්, ඛනිජ සහ සහල් ය. ධාන්‍ය වගර් අඩංගු මෙම ආහාරය සාමාන්‍ය කෙටි ආහාර සඳහා වූ සෞඛ්‍ය සම්පන්න විකල්පයක් ලෙස ප්‍රකට ආහාරයක් වන අතර පොදුවේ විටමින්, ඛනිජ ලවණ සහ කැල්සියම් වැනි පෝෂණ මූලාංගවල ගුණයෙන් එය අනූන ය. ධාන්‍ය සහිත මෙම ආහාරය සඳහා වූ ජනප්‍රියත්වය සහ ඉල්ලුම යන දෙකම ඉහළ මට්ටමක පවතින බව දැකිය හැකි අතර, විශේෂයෙන්, ගෝලීය හා දේශීය පාරිභෝගිකයාගේ වියදම් කිරීමේ හැකියාව වැඩි වීමට සමගාමීව එය තව දුරටත් වධර්නය වනු ඇත.

සුපෝෂ යනු පෝෂණ ගුණයෙන් ඉතා පොහොසත් අතිරේක ආහාරයකි. ශ්‍රී ලංකාවේ පොදු ජන වෙළඳපොළ "දැරිය හැකි මිලක් සහිත පෝෂණයට" යටත් ආකාරයේ නැඹුරුවක් ගෙන ඇති වුව ද, අඩු ආදායම්ලාභී පවුල් අතර පවත්නා ප්‍රෝටීන් පෝෂණ ඌණතා තත්වයට පිළියම් යෙදිය හැකි එක් තනි ආහාර නිෂ්පාදනයක් එහි වෙළඳපොළ තුළ දක්නට නැත. එබැවින්, සුපෝෂ කැලරි බාර් නිෂ්පාදනයෙහි ප්‍රධාන ඉදිරි දැක්ම වනුයේ, ග්ලූටන් සංඝටක රහිත සහ ඉහළ ප්‍රෝටීන් පෝෂණ අගයක් සහිත "අඩු මිලකට" ලබා ගත හැකි පෙර පිසූ අනුභවය සඳහා වහා සූදානම් ආහාර නිෂ්පාදනයක් ප්‍රවධර්නය කිරීමයි.

සුපෝෂ කැලරි බාර් - සහල් මිශ්‍ර

සුපෝෂ කැලරි බාර්

අපගේ දැක්ම

නවෝත්පාදනය තිරසාරභාවය හා කාර්යක්ෂමතාවය තුලින්

මන්දපෝෂණය තුරන් කිරිමෙහිලා

ජාතිය උදෙසා වූ විශ්වාසදායක පෝෂ්‍යගුණ

සපයන්නා බවට පත්වීම.

අපගේ මෙහෙවර

ඉලක්කගත ප්‍රතිලාභීන් වෙත උපරිම පෝෂණගුණ සපිරි
ත්‍රිපෝෂ ආහාරය සපයාදීම මගින් ද ,
දේශීය ගොවියා වෙතින් අමුද්‍රව්‍ය මිලදී ගනිමින්
පෝෂණීය අතිරේක ආහාර නිෂ්පාදන
වෙළඳපොලට හඳුන්වා දීම මගින් ද
සෞඛ්‍ය සම්පන්න ජාතියක් උදෙසා දායක වීම
අපගේ අරමුණ වේ.

විස්තීර්ණ විශ්ලේෂණය

පළමුව, වටිනාකම් හඳුනා ගැනුනු අතර, දැක්ම සහ මෙහෙවර ඒවා තුළින් උකහා ගන්නා ලදී.

ඉලක්ක සහ උපාය මාර්ග පිහිටුවා ගනු ලැබ ඇත්තේ, පිළිවෙළින් පරතර විශ්ලේෂණය (සම්මුඛ සාකච්ඡාවලින් හඳුනා ගන්නා ලද) සහ පාරිසරික විශ්ලේෂණය මගින් එක්රැස් කර ගන්නා ලද අභ්‍යන්තර හා බාහිර යන සාධක ද්වයම සලකා බලමිනි.

වැඩිදියුණු කිරීමේ ක්ෂේත්‍ර 5 කට පරතර වර්ග කරනු ලැබ තිබේ. මෙම පරතර සහ පාරිසරික විශ්ලේෂණ සැලකිල්ලට ගනිමින් කේන්ද්‍රීය යොමුගත ක්ෂේත්‍ර පිහිටුවා ගැනිණි. මෙම සියලු කරුණු කෙරෙහි අවධානය යොමු කරමින්, දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා පිළිවෙළින් ඉලක්ක, උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කරන ලදී.



වටිනාකම් සහ යොමුගත ක්ෂේත්‍ර

ස්වකීය දැක්ම සහ මෙහෙවර සපුරා ගැනීමට නම්, සමාගම විසින් තිරව බැඳී කටයුතු කරනු ලැබිය යුතු පහත දැක්වෙන වටිනාකම්, මූලධර්ම ලෙස හඳුනා ගැනිණි:

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමට සිය ඉලක්ක සහ උපාය මාර්ග පෙළගස්වා ගැනීම සඳහාත් අවසාන වශයෙන්, එහි දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහාත් සහය වනු පිණිස අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර හතරක් (4) හඳුනා ගන්නා ලදී.

අපගේ කැපවීම

ස්වයංපෝෂිත වන අතරම රටේ මන්දපෝෂණය තුරන් කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් පාර්ශවකරුවන්ගේ වටිනාකම උපරිම කිරීම.

අපගේ මෙහෙයුම්

අනලස්ව ක්‍රියාත්මක වෙමින් පෝෂණීය ආහාර නිෂ්පාදනවල තිරසාර ප්‍රභවය සලසා ගැනීම, ඒවා සැකසීම, අලෙවි කිරීම සහ බෙදා හැරීම කෙරෙහි අවධානය යොමු කිරීම.

අපගේ නිෂ්පාදනය

අවසාන පාරිභෝගිකයාට ලබා දෙන නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහ ප්‍රමිතිය කෙරෙහි අවධානය යොමු කිරීම.

අපගේ ජනතාව

අපගේ වටිනාකම වත්කම වන සේවක සේවිකාවන් කෙරෙහි අවධානය යොමු කිරීම.

ඉලක්ක

ඉලක්ක නිමවා පිහිටුවා ගෙන ඇත්තේ, ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම විසින් සිය අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර තුළ සාර්ථක වීමට ගත යුතු ක්‍රියාමාර්ග කවරේද යන්න පිළිබඳ දිශානතියක් සැපයීම සඳහා ය. මෙමගින්, සමාගමේ උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලසුම් පිළිබඳව දැනුම් දීමක් කෙරෙනු ඇත.

අපගේ කැපවීම

අංකය	ඉලක්කය	විස්තරය
ඉලක්ක 1	අපගේ පාර්ශවකරුවන්ගේ සමාජ සුබසාධන අරමුණු සාක්ෂාත් කර ගැනීම	සමාජයට සමාගමේ දායකත්වය වැඩි දියුණු කරමින් ලබා දීමට කටයුතු කිරීම.

අපගේ මෙහෙයුම්

අංකය	ඉලක්කය	විස්තරය
ඉලක්ක 2	යටිතල පහසුකම් සහ තාක්ෂණික දියුණුව පවත්වා ගැනීම.	නිෂ්පාදන කම්හල, ගබඩා කිරීම, සැපයුම් සහ තාක්ෂණය වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම, පිරිවැය අවම කිරීම සහ පාර්ශවකරුවන්ගේ වටිනාකම උපරිම කිරීම සඳහා නව විසඳුම් සොයා ගැනීම.
ඉලක්ක 3	ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා මෙහෙයුම් විශිෂ්ටත්වය ළඟා කර ගැනීම.	ජාතිය උදෙසා මනා පෝෂණයක් ලබාදීම සඳහා ඵලදායී මෙහෙයුම් කළමනාකරණයක් තුළින් තිරසර ව්‍යාපාරික පරිසරයක් ගොඩනැගීම.

ඉලක්ක

අපගේ නිෂ්පාදනය

අංකය	ඉලක්කය	විස්තරය
ඉලක්ක 4	පර්යෙෂණය සහ නවෝත්පාදනය තුළින් නිෂ්පාදන විශිෂ්ටත්වය අත් කර ගැනීම.	නවෝත්පාදනය සහ තාක්ෂණික සංවර්ධනය තුළින් නිවැරදි නිෂ්පාදන සැපයීම.

අපගේ ජනතාව

අංකය	ඉලක්කය	විස්තරය
ඉලක්ක 5	ආයතනික ඉගෙනීම සහ ධනාත්මක වැඩ පරිසරයක් ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම.	සේවකයින් සහ ඔවුන්ගේ සේවායෝජකයා තම සහ සමාගමේ සංවර්ධනය විවෘතව හඳුනාගෙන අගය කරන ඉගෙනුම් සංස්කෘතියක් නිර්මාණය කිරීම මගින් සේවක උන්නතිය සහ සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම.

සභාපතිතුමාගේ පණිවිඩය

සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුබද්ධ පූර්ණ රජය සතු සමාගමක් ලෙස 2011 වර්ෂයේදි ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම සංස්ථාගත කිරීමේදි සංස්ථාවලියේ දක්වා ඇති අරමුණුවලින් ප්‍රධානතම අරමුණ පෝෂණයෙන් සපිරි නිරෝගිමත් ජනතාවක් බිහි කිරීමේ ජාතික මෙහෙවර පෙරදැරිව ත්‍රිපෝෂ අතිරේක ආහාරය නිෂ්පාදනය කොට සෞඛ්‍ය සායන මගින් ශ්‍රී ලංකාවේ වෙසෙන සියළුම ගර්භනි මව්වරුන්, කිරිදෙන මව්වරුන් හා වයස අවුරුදු 05ට අඩු, බර අඩු දරුවන් උදෙසා නොමිලේ බෙදා හැරීම සිදු වූ අතර 2023 වසරේද එම ඉලක්කය සැපිරීමට හැකි විය.

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ 2023 වර්ෂයේ අධීක්ෂණය වූ ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම, විශේෂයෙන්ම අමුද්‍රව්‍ය ප්‍රදාන ලැබීම් හමුවේ (WFP ආයතනය සහ SAGT ආයතනය මගින්) නිෂ්පාදන කටයුතු සීමිත සම්පත් ප්‍රමාණයක් පමණක් භාවිතා කරමින් 2023 වර්ෂයේ සමස්ථ නිෂ්පාදනය මෙ.ටොන් 9,163 සීමාව පසු කිරීමට සමත් විය.

2023 වර්ෂයේ සමස්ථ ආදායම රු. මිලියන 5,486.74 ක් වූ අතර සමස්ථ වියදම රු. මිලියන 4,675.65 කි. ඒ අනුව බදු පෙර ලාභය රු. මිලියන 811.09 කි.

මෙම වර්ෂයේ ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා දරන ලද මුදල රු මිලියන 87.64ක් වූ අතර 2023 වර්ෂයේ අතුරු ලාභාංශ ලෙස මහා භාණ්ඩාගාරයට රු.මිලියන 65ක් ලබාදීමට කටයුතු කල අතර 2023 වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව බදු පසු ලාභයෙන් අවම 30% ලාභාංශ මුදල් අමාත්‍යාංශය වෙත 2024 මූල්‍ය වර්ෂය අවසන් වීමට පෙර බෙදාහැරීමට කටයුතු කරන බවද සඳහන් කිරීමට කැමැත්තෙමි.

මේ සඳහා අපහට සහයෝගය දැක්වූ අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා, සෞඛ්‍ය අමාත්‍ය ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල මහතා සහ ලේකම් එස්. ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත මැතිතුමා, මුදල් අමාත්‍යාංශයේ ලේකම් හා මහා භාණ්ඩාගාරයේ ලේකම් ගරු කේ. එම්. මහින්ද සිරිවර්ධන මැතිතුමා, අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සමස්ත සේවක මණ්ඩලය හා අඛණ්ඩ නිෂ්පාදනයක් උදෙසා නිසිකලට අමුද්‍රව්‍ය සපයන අපගේ සැපයුම්කරුවන් හා අපහට නන් අයුරින් සහය දක්වන සියළු දෙනා ඉතා කෘතඥ පූර්වකව සිහිපත් කරමි.

දිප්ති කුලරත්න
සභාපති
ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

සංවිධාන ව්‍යුහය



- Acc.Offi - ගිණුම් නිලධාරි
- AO - පරිපාලන නිලධාරි
- Dist - බෙදාහැරීමේ නිලධාරි
- FO - මූල්‍ය නිලධාරි
- IA - අභ්‍යන්තර විගණක
- Mgt Assis - කළමනාකරණ සහකාර
- Pur - මිලදී ගැනීමේ නිලධාරි
- Prod - නිෂ්පාදන නිලධාරි
- WH - ගුදම් ගබඩා නිලධාරි

අධ්‍යක්ෂ මණ්ඩලය

දිප්ති කුලරත්න මහතා

සභාපති

වෛද්‍ය අසේල ගුණවර්ධන මහතා
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය පෝෂණ හා දේශීය
වෛද්‍ය අමාත්‍යාංශය

වෛද්‍ය චිත්‍රමාලි ද සිල්වා
මහත්මිය
මාතෘ හා ළමා කාර්යංශය
සෞඛ්‍ය පෝෂණ හා දේශීය

චමිලා කරුණාතිලක මහත්මිය
අධ්‍යක්ෂ
මුදල්,ආර්ථික ස්ථායිකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

තේජා හේරත් මහත්මිය
ජ්‍යේෂ්ඨ පර්යේෂණ නිළධාරිණී
කාර්මික තාක්ෂණික ආයතනය

ලක්මිනි එන් මාගොඩරත්න
මහත්මිය
පෝශණ සම්බන්ධිකරණ අංශය
සෞඛ්‍ය පෝෂණ හා දේශීය
වෛද්‍ය අමාත්‍යාංශය

අධ්‍යක්ෂ මණ්ඩලය

නිතිඥ චතුර්නික කේශංග
පෙරේරා මහතා
නීති උපදේශක

සුදත් කරුණාරත්න මහතා
ප්‍රධාන මූල්‍ය නිළධාරි i
සෞඛ්‍ය අමාත්‍යාංශය
(නිරීක්‍ෂක)

තනුජා ප්‍රියදර්ශනි අල්විස්
මහත්මිය
අධ්‍යක්‍ෂ මණ්ඩල ලේකම්

සංගමික කළමණාකාරිත්වය

චම්පික සල්ගාදු මහතා
ජ්‍යෙෂ්ඨ කළමණාකරු
(මෙහෙයුම්)

තනුජා ප්‍රියදර්ශනී අල්විස් මහත්මිය
ජ්‍යෙෂ්ඨ කළමණාකරු
(මානව සම්පත් හා නිති)

පි. ජී. පි. කේ දසනායක මහතා
නිෂ්පාදන හා ඉංජිනේරු කළමණාකරු

ඩි. බි. තරිඳු චාමික මහතා
මුල්‍ය කළමණාකරු

අජිත් නිශ්ශංක මහතා
අලෙවි කළමණාකරු

අජිත් දිසානායක මහතා
තත්ත්ව පාලන කළමණාකරු

නෙළුම් මෙන්ඩිස් මහත්මිය
තත්ත්ව ආරක්ෂණ
කළමණාකරු

සමස්ථ නිෂ්පාදනය පිළිබඳ තොරතුරු

වර්ෂය	2019	2020	2021	2022	2023
ත්‍රිපෝෂ නිෂ්පාදනය (මෙ ටොන්)	11,712	5,988	5,568	1,582	7,342
සුපෝෂ නිෂ්පාදනය (මෙ ටොන්)	3,717	1,939	2,890	1,170	1,821
මුළු නිෂ්පාදනය (මෙ ටොන්)	**15,429**	**7,927**	**8,458**	**2,752**	**9,163**

2019 සිට 2023 වසර දක්වා සමස්ථ නිෂ්පාදනය ප්‍රස්ථාරයක් මගින්



ත්‍රිපෝෂ බෙදාහැරීමේ තොරතුරු

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල හා වෙනත් ආයතන	මව්වරුන් (ගභර්ණී හා කිරිදෙන මව්වරු)	ළමයින්			මුළු ප්‍රතිලාභීන්
		මාස 06-අවුරුදු 03 ත් අතර	අවුරුදු 03-05 ත් අතර		
			සාමාන්‍ය	ළය රෝග සායන	
අම්පාර	**4,557**	6,399	6,435	150	**17,541**
අනුරාධපුරය	**13,725**	21,250	18,390	135	**53,500**
බදුල්ල	**11,430**	16,103	14,880	255	**42,668**
මඩකලපුව	**11,485**	11,536	9,525	180	**32,726**
කොළඹ මහ නගර සභාව	**5,670**	5,115	3,990	-	**14,775**
කොළඹ	**17,685**	16,862	18,345	-	**52,892**
ගාල්ල	**13,545**	14,752	13,590	300	**42,187**
ගම්පහ	**28,890**	26,472	18,000	-	**73,362**
හම්බන්තොට	**9,300**	13,508	13,830	75	**36,713**
යාපනය	**8,898**	7,323	6,735	270	**23,226**
කල්මුනේ	**10,180**	7,660	7,395	150	**25,385**
කළුතර	**10,815**	11,816	7,395	375	**30,401**
මහනුවර	**23,672**	26,307	24,945	270	**75,194**
කෑගල්ල	**12,825**	10,871	11,415	210	**35,321**
කිලිනොච්චිය	**2,236**	1,946	1,440	30	**5,652**
කුරුණෑගල	**26,442**	27,198	24,645	225	**78,510**
මන්නාරම	**2,322**	1,645	1,665	30	**5,662**
මාතලේ	**8,134**	8,747	8,715	150	**25,746**
මාතර	**11,160**	17,224	17,625	150	**46,159**
මොනරාගල	**9,861**	10,257	8,955	60	**29,133**
මුලතිව්	**1,920**	1,672	1,890	30	**5,512**
නුවරඑළිය	**10,680**	35,775	27,075	180	**73,710**
පොළොන්නරුව	**7,530**	9,036	8,565	60	**25,191**
පුත්තලම	**13,846**	10,303	8,820	30	**32,999**
රත්නපුර	**12,735**	20,907	17,355	255	**51,252**
ත්‍රිකුණාමලය	**8,829**	8,527	6,930	90	**24,376**
වවුනියාව	**2,791**	2,557	2,145	60	**7,553**
ජාතික සෞඛ්‍ය විද්‍යායතනය කලුතර/බේරුවල	**4,170**	5,102	4,425	-	**13,697**
ළය රෝහල	**-**	-	-	1,680	**1,680**
රිජ්වේ ආර්යා ළමා රෝහල	**-**	-	105	-	**105**
අපේක්ෂා රෝහල - මහරගම	**-**	-	30	-	**30**
ආයති මධ්‍යස්ථානය - රාගම	**-**	-	30	-	**30**
ළය රෝහල - වැලිසර	**-**	-	120	-	**120**
එකතුව	**305,333**	**356,870**	**315,405**	**5,400**	**983,008**

* 2023 වර්ෂයේ ත්‍රිපෝෂ බෙදාහැරීම් සිදු කරන ලද්දේ ගර්භණී/ කිරිදෙන මව්වරුන් සහ වයස අවු.03-05 ත් අතර ළමයින් සඳහා පමණි.

* ඒ අනුව සම්පූර්ණ ත්‍රිපෝෂ ප්‍රතිලාභීන් සංඛ්‍යාව - **626,138** කි.

ත්‍රිපෝෂ බෙදාහැරීමේ තොරතුරු

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල සහ වෙනත් ආයතන	2023 වර්ෂයේ මුලු ප්‍රතිලාභීන්	2023 වර්ෂයේ ත්‍රිපෝෂ බෙදාහැරීම (මාස්ටර් බෑග්)
අම්පාර	11,142	5,191
අනුරාධපුරය	32,250	12,249
බදුල්ල	26,565	15,425
මඩකලපුව	21,190	11,292
කොළඹ මහ නගර සභාව	9,660	7,046
කොළඹ	36,030	20,560
ගාල්ල	27,435	12,139
ගම්පහ	46,890	26,231
හම්බන්තොට	23,205	13,036
යාපනය	15,903	8,462
කල්මුණේ	17,725	9,446
කළුතර	18,585	10,348
මහනුවර	48,887	19,517
කෑගල්ල	24,450	10,868
කිලිනොච්චිය	3,706	2,221
කුරුණෑගල	51,312	20,511
මන්නාරම	4,017	2,410
මාතලේ	16,999	9,054
මාතර	28,935	15,398
මොනරාගල	18,876	8,802
මුලතිව්	3,840	1,834
නුවරඑළිය	37,935	19,794
පොළොන්නරුව	16,155	7,608
පුත්තලම	22,696	13,884
රත්නපුර	30,345	15,926
ත්‍රිකුණාමලය	15,849	8,450
වවුනියාව	4,996	2,993
ජාතික සෞඛ්‍ය විද්‍යායතනය - කලුතර/බේරුවල	8,595	3,448
ළය රෝහල	1,680	1,000
රිජ්වේ ආර්යා ළමා රෝහල	105	70
අපේක්ෂා රෝහල - මහරගම	30	12
ආයති මධ්‍යස්ථානය - රාගම	30	12
ළය රෝහල - වැලිසර	120	53
එකතුව	**626,138**	**315,290**

මාසය	2023 ත්‍රිපෝෂ බෙදාහැරීම (මාස්ටර් බෑග්)
ජනවාරි	27,705
පෙබරවාරි	28,049
මාර් තු	20,728
අප්‍රේල්	364
මැයි	14,088
ජුනි	29,989
ජුලි	30,978
අගෝස්තු	21,814
සැප්තැම්බර්	40,684
ඔක්තොම්බර්	46,815
නොවැම්බර්	29,495
දෙසැම්බර්	24,581
එකතුව	**315,290**

විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින් හා සහභාගි වු අනෙකුත් නිළධාරින්

i. චමිලා කරුණාතිලක මිය	-	සභාපති, විගණන හා කළමනාකරණ කමිටුව, අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
ii. වෛද්‍ය චිත්‍රමාලි ද සිල්වා මිය	-	සාමාජික, විගණන හා කළමනාකරණ කමිටුව අධ්‍යක්ෂිකා, ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
iii. ආචාර්ය තේජා හේරත් මිය	-	සාමාජික, විගණන හා කළමනාකරණ කමිටුව අධ්‍යක්ෂිකා, ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
iv. B.G. දර්ශන මයා	-	නිරීක්ෂක, විගණන හා කළමනාකරණ කමිටුව, විගණන අධිකාරි, ජාතික විගණන කාර්යාලය
v. තනුජා ප්‍රියදර්ශනි අල්විස් මිය	-	ජ්‍යේෂ්ඨ කළමනාකරු (මානව සම්පත් හා නීති) ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
vi. ඩී. බී. තරිදු චාමික මයා	-	මූල්‍ය කළමනාකරු, ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
vii. එල්. ජේ. සරත් ප්‍රේමචන්ද්‍ර මයා	-	කැඳවුම්කරු, විගණන හා කළමනාකරණ කමිටුව අභ්‍යන්තර විගණක, ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

2023 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03ක් පහත දින වලදී පවත්වන ලදී

01	ප්‍රථම රැස්වීම	2023 ජුලි මස 04 දින
02	දෙවන රැස්වීම	2023 ඔක්තෝම්බර් මස 19 දින
03	තෙවන රැස්වීම	2023 නොවැම්බර් මස 28 දින

සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු

01 2019 වර්ෂයේ ස්ථාවර වත්කම් වල ප්‍රත්‍යාගණන වටිනාකම් ප්‍රතිස්ථාපනය කිරීම

02 2022 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ සඳහන් විශේෂ කරුණු

03 ලාභාංශ ගෙවීමට අදාල කරුණු

04 අබලි ද්‍රව්‍ය ඉවත් කිරීමේ ක්‍රමවේදය

ආහාර නිෂ්පාදන අංශය ආශ්‍රිතව හාරදූර සබඳතාවක් ඇති ආයතනයක් ලෙස, වටිනාකමක් නිර්මාණය කිරීමේ ස්වකීය හැකියාව කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි බාහිර හා අභ්‍යන්තර අවදානම් පරාසයකට නියත වශයෙන්ම සමාගම නිරාවරණය වේ. සමාගමේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය, ව්‍යාපාරය හා සම්බන්ධ අවදානම් අවම කිරීම සහ කොටස් හිමියන්ගේ වටිනාකම් උත්පාදනය උපරිම කිරීම අතර ප්‍රශස්ත සමතුලිතතාවයක් ඇති කරයි. අවදානම් කළමනාකරණය යනු, ආයතනිකව ව්‍යාප්ත විනයක් ද වන අතර, පැහැදිලිව නිර්වචනය කරන ලද පාලන ව්‍යුහයන්, ප්‍රතිපත්ති රාමු සහ ක්‍රියා පටිපාටි මගින් අවදානම් හඳුනා ගැනීම, කළමනාකරණය කිරීම සහ ඒවා දුර්මුඛ කිරීම සඳහා ස්ථාවර ආකාරයකින් ක්‍රියාත්මක වේ.

අවදානම් පාලනය

සමාගමේ අවදානම් පැතිකඩ ඵලදායි ලෙස කළමනාකරණය කිරීමේ මුදුන් වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය උසුලයි. මූල්‍ය අවදානම් විෂයයෙහි මෙන්ම තෝරාගත් සේවක, සේවාදායක සහ පාරිසරික යන අංශ ආශ්‍රිත අවදානම් හඳුනා ගැනීම, අධීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම යන කාර්යයේ දී ද ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරන විගණන කමිටුව, එහි අවදානම හා බැඳි අධීක්ෂණ රාජකාරි සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ. මූල්‍ය නොවන අවදානම් ප්‍රධාන වශයෙන් ව්‍යාපාරික ඒකක මට්ටමින් / ක්‍රියාකාරී මට්ටමින් පැන නගින අතර, ආයතනය පුරා ඇති අවදානම් ක්‍රියාශීලීව හඳුනා ගැනීම සහ අධීක්ෂණය කිරීම සඳහා සේවකයින් වගකිව යුතු ය.



අවදානම් කළමනාකරණය විෂයයෙහි ප්‍රතිපත්ති සහ ඒ වෙත ප්‍රවේශය

සමාගම, ස්වකීය අවදානම් කළමනාකරණය කිරීමේ සහ මැනීමේ කාර්යයේ දී, ගෝලීය වශයෙන් පිළිගත් ආරක්ෂක මාදිලි තුනක් අනුගමනය කරයි. එමගින් අවදානම් කළමනාකරණයේ ද, අවදානම හඳුනා ගැනීමේ ද, අවදානම තක්සේරු කිරීමේ ද, අවදානම දුර්මුඛ කිරීමේ ද, අවදානම වාර්තා කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ ද කර්තව්‍යයන් පැහැදිලිව වෙන් කර තැබීම සහතික කරයි.



- අවදානම් හඳුනාගැනීම : මුළු මහත් සේවක සහභාගිත්වය සහිතව, සියලු ව්‍යාපාරික ඒකක සහ කාර්යයන් හරහා අවදානම ක්‍රියාශීලීව හඳුනා ගැනීම සබැඳේ.
- අවදානම් තක්සේරුව : විභව සම්භාවිතාව සහ බලපෑමේ විශාලත්වය මත පදනම්ව අවදානම් තක්සේරු කිරීම.
- අවදානම දුර්මුඛ කිරීම : අවදානම ඵලදායී ලෙස දුර්මුඛ කිරීම සඳහා ක්‍රියාකාරී සැලසුම් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- අවදානම් අධීක්ෂණය / වාර්තාකරණය : ප්‍රධාන අවදානම් දර්ශක පිළිබඳව විගණන හා කළමනාකරණ කමිටුව වාර්තා කිරීම සහ අඛණ්ඩ පදනමක් මත ප්‍රධාන නිරාවරණ අධීක්ෂණය කිරීම.

අවදානම් රුචිකතාව සහ උපධාරණය

අවදානම් රුචිකතාව සහ උපධාරණය මගින් ව්‍යාපාර සැලසුම් කිරීම, සම්පත් වෙන්කර දීම සහ මෙහෙයුම් කළමනාකරණය සමඟ අවදානම් කළමනාකරණය ඒකාබද්ධ කරන හෙයින් අපගේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය කෙරෙහි එය අත්‍යවශ්‍ය වේ, සමාගම, ස්වකීය අරමුණු සහ ඉලක්ක කරා හඹා යාමේ දී සමූහය විසින් පිළිගනු ලැබීමට කැමති අවදානම් සීමාවේ මුවදොර, අවදානමේ උපධාරණ මට්ටම මගින් නිරූපණය කර දක්වයි.

අඩු අවදානම	මැදි අවදානම	අධි අවදානම
අවදානම් ප්‍රතිකර්මය : පිළිගත හැකි දෛනික ක්‍රියා පටිපාටි හරහා කළමනාකරණය කෙරෙන අතර නිශ්චිත සම්පත් අවශ්‍ය වීමේ ඉඩක් නොමැත. **අවදානම් ප්‍රතිචාරය**	**අවදානම් ප්‍රතිකර්මය : පිළිගැනීම හා අධීක්ෂණය කිරීම** ප්‍රතිකර්ම සැලැස්ම මෙහෙයුම් කළමණාකරුවන් විසින් සංවර්ධනය කර අධීක්ෂණය කිරීමට නියමිත ය. **අවදානම් ප්‍රතිචාරය** නිශ්චිත අධීක්ෂණ / ප්‍රතිචාර ක්‍රියා පටිපාටි හරහා කළමනාකරණය කෙරේ.	**අවදානම් ප්‍රතිකර්මය : අවදානම් ප්‍රතිචාරය වළක්වා ගැනීම** ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ අවධානය අවශ්‍ය වේ. එමෙන්ම, කළමනාකරණ වගකීම නිශ්චිතව දක්වා තිබිය යුතු ය.

KPI යනු, ප්‍රධාන කාර්ය සාධන දර්ශකයක් කෙටියෙන් නම් කෙරෙන ආකාරයයි. එය, නිශ්චිත ඉලක්කයක් හෝ අරමුණක් කරා දිවෙන ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා භාවිතා කරනු ලබන, මැනිය හැකි සහ ප්‍රමාණ කළ හැකි මිතිකයකි. මෙම KPI දර්ශක, ආයතනවලට තම ශක්තීන් සහ දුර්වලතා හඳුනා ගැනීමටත්, දත්ත මත පදනම් වූ තීරණ ගැනීමට සහ කාර්ය සාධනය ප්‍රශස්ත කර ගැනීමටත් උපකාර වේ.

මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශක මගින් ඒ ඒ වැඩ කණ්ඩායම්වලට යොමු වීම සඳහා අවශ්‍ය ඉලක්ක, ප්‍රගතිය මැන බැලීම සඳහා අවශ්‍ය සන්දිස්ථාන සහ සමස්ත ආයතනයම ආවරණය වන පරිදි තීරණ ගැනීමේ දී නිසි මග පෙන්වීමට උපකාර වන තීක්ෂණ නිරීක්ෂණයන් සපයා දෙයි. ප්‍රධාන කාර්ය සාධන දර්ශක අධීක්ෂණය කිරීමෙන්, ආයතනවලට තම ශක්තීන් සහ දුර්වලතා ඇති ප්‍රදේශ හඳුනා ගැනීමටත්, දත්ත මත පදනම් වූ තීරණ ගැනීමට සහ කාර්ය සාධනය ප්‍රශස්ත කිරීම පිණිස ක්‍රියාමාර්ග ගැනීමටත් හැකි ය.

දර්ශක	වර්ෂ		
	2021	2022	2023
නිෂ්පාදන සැලැස්ම සාක්ෂාත් කර ගැනීම (සම්පූර්ණ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් වලින්)	8,171	2,752	9,163
විකුණුම් වර්ධනය = (ප්‍රවර්තන කාල පරිච්ඡේදයේ ශුද්ධ විකුණුම් - පෙර කාල පරිච්ඡේදයේ ශුද්ධ විකුණුම්) / පෙර කාල පරිච්ඡේදයේ ශුද්ධ විකුණුම්	2.81%	26.73%	265.67%
දළ ලාභ ආන්තිකය = (ආදායම - විකුණූ භාණ්ඩවල පිරිවැය) / ආදායම	10.86%	3.16%	16.44%
ශුද්ධ ලාභ ආන්තිකය (බදු පෙර) = (මුළු ආදායම - ආදායම් බදු රහිත මුළු වියදම්) / මුළු ආදායම	6.36%	(5.07%)	15.19%
කාරක ප්‍රාග්ධනය = ජංගම වත්කම් - ප්‍රවර්තන බැරකම් (රු.මි.)	786.29	876.94	1,197.86

නිශ්චිත ඉලක්කවලට අදාළ අනෙකුත් ප්‍රමාණාත්මක මූල්‍ය සහ මූල්‍ය නොවන ප්‍රධාන කාර්ය සාධන දර්ශක සමාගමේ ආයතනික සැලැස්ම තුළ සවිස්තරාත්මකව දක්වා ඇත.

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම හා සම්බන්ධ ප්‍රධාන තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) වනුයේ :

SDG 2

කුසගින්න නිමා කිරීම, ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය වැඩි දියුණු කිරීම සහ තිරසාර කෘෂිකර්.මාන්තය ප්‍රවර්ධනය කිරීම

SDG 9

ඔරොත්තු දී පවතින යටිතල පහසුකම් ගොඩනැගීම, ඇතුළාන්තීය සහ තිරසාර කාර්මිකකරණය ප්‍රවර්ධනය කිරීම සහ නවෝත්පාදන පෝෂණය කිරීම

SDG 12

තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදන රටා සහතික කිරීම

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ ඉලක්ක, තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ සමපාත වන බවට සහතික කිරීම සඳහා, යෝජිත ඉලක්ක සමඟ තිරසාර සංවර්ධන ඉලක්ක සැලසුම් ගත කරන ලදී.

යොමුගත ක්ෂේත්‍රය	ඉලක්ක	තිරසර සංවධර්න ඉලක්කය
අපේ කැපවීම	අපගේ පාර්ශවකරුවන්ගේ සමාජ සුබසාධන අරමුණු සාක්ෂාත් කර ගැනීම	2
අපේ මෙහෙයුම්	යටිතල පහසුකම් සහ තාක්ෂණික දියුණුව පවත්වා ගැනීම	9, 12
	ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා මෙහෙයුම් විශිෂ්ටත්වය ළඟා කර ගැනීම	
අපේ නිෂ්පාදනය	පර්යේෂණය සහ නවෝත්පාදය තුළින් නිෂ්පාදන විශිෂ්ටත්වය ළඟා කර ගැනීම	-
අපේ මිනිසුන්	ආයතනික ඉගෙනීම සහ ධනාත්මක වැඩ පරිසරයක් ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම	-

උපායමාර්ග

සමාගමේ දැක්ම සාක්ෂාත් කර ගන්නේ කෙසේද යන්න පිළිබඳ මග පෙන්වීමක් ලබා දීම මගින් ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමට සිය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තවදුරටත් උපකාර වන උපාය මාර්ග ඊළඟට නිර්මාණය කර ගන්නා ලදී.

	1 වන ඉලක්කය | අපගේ පාර්ශවකරුවන්ගේ සමාජ සුබසාධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ උපායමාර්ග
1.1	සුභසාධන නිෂ්පාදය අඛණ්ඩව සැපයීම සහතික කිරීම
1.2	ප්‍රජා සංවර්ධනයට සහාය වීම

	2 වන ඉලක්කය | යටිතල පහසුකම් සහ තාක්ෂණික දියුණුව පවත්වා ගැනීමේ උපායමාර්ග
2.1	ගබඩා ධාරිතාව සහ අනෙකුත් අදාළ පහසුකම් වැඩි දියුණු කිරීම
2.2	විශ්වසනීයත්වය සහ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා පවතින නිෂ්පාදන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
2.3	කර්මාන්තශාලාව තුළ ආධාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
2.4	තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම

	3 වන ඉලක්කය | ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා මෙහෙයුම් විශිෂ්ටත්වය ළඟා කර ගැනීමේ උපායමාර්ග
3.1	අභ්‍යන්තර ව්‍යාපාර ක්‍රියාවලි විධිමත් කිරීම
3.2	වෙළඳපළ ප්‍රවේශනය සහ නිෂ්පාදන ලබා ගැනීමේ හැකියාව වැඩි දියුණු කිරීම
3.3	ධනාත්මක වැඩ පරිසරයක් සහතික කිරීම සඳහා තත්ත්ව සහ ආරක්ෂණ ප්‍රමිතීන්ට අනුකූල වීම
3.4	නිෂ්පාදන සඳහා ප්‍රවර්ධන ක්‍රියාකාරකම් මෙහෙයවීම
3.5	රජයේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සමඟ අනුකූල වීම සහතික කිරීම

	4 වන ඉලක්කය | පර්යේෂණය සහ නවෝත්පාදය තුළින් නිෂ්පාදන විශිෂ්ටත්වය ළඟා කර ගැනීමේ උපායමාර්ග
4.1	නිෂ්පාදන සංවර්ධනය සහ තත්ත්ව පරීක්ෂාව සඳහා පහසුකම් සැලසීම පිණිස සම්පත් වැඩි දියුණු කිරීම
4.2	සමාගම විසින් පිරිනමනු ලබන නිෂ්පාදන ඒවාට අදාළ ඉලක්ක වෙළඳපොළට හඳුන්වා දීම සහ වැඩි දියුණු කිරීම

	5 වන ඉලක්කය | ආයතනික ඉගෙනීම සහ ධනාත්මක වැඩ පරිසරයක් ප්‍රවර්ධනය කිරීම සහ වැඩි දියුණු කිරීමේ උපායමාර්ග
5.1	බඳවා ගැනීම් සහ අනුක්‍රමික සැලසුම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම
5.2	ඵලදායී පුහුණු වැඩසටහන් හරහා පුද්ගල සංවර්ධනය දිරිමත් කිරීම
5.3	පරිපූර්ණ කාර්ය සාධන කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම

පාර්ශවකාර විශ්ලේෂණය

පාර්ශවකාර විශ්ලේෂණය යනු, ස්වකීය බලය සහ උනන්දුව අනුව අදාළ පාර්ශවකරුවන් හඳුනා ගැනීම සහ විශ්ලේෂණය කිරීම සඳහා වූ ක්‍රමානුකූල ක්‍රමයකි. අධි බලැති හා අධි උද්යෝගී පාර්ශවකරුවන් ප්‍රධාන ක්‍රීඩකයින් බවට පත් වේ. අඩු බලය සහ අඩු උනන්දුව වැදගත් වන්නේ අවම වශයෙනි.



ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම සම්බන්ධයෙන් ඉහළම බලය සහ උනන්දුව ඇත්තේ, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට, මහ භාණ්ඩාගාරයට, සෞඛ්‍ය අමාත්‍යාංශයට සහ කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයට ය. මෙම වෘත්තපාදයේ සිටින සෙසු අය ද ඇතුළුව මෙම පාර්ශවකරුවන් සමීපව නිරීක්ෂණය කළ යුතු ය.

- අමුද්‍රව්‍ය සැපයුම්කරුවන් ද, ශ්‍රී ලංකා දුම්රිය, මුදල් අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම යන ආයතන ද ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම විෂයයෙහි ඉහළ බලයක් දක්වන සහ සාපේක්ෂ වශයෙන් අඩු උනන්දුවක් ඇති පාර්ශවකරුවන් වේ. මෙම පාර්ශවකරුවන්ට ඉහළ බලයක් ඇති බැවින්, ඔවුන්ගේ උනන්දුව එතරම් ඉහළ මට්ටමක නොතිබුණ ද, ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම ඔවුන් තෘප්තිමත් වන ආකාරයෙන් කටයුතු කළ යුතු ය.

- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින්, මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින්, ප්‍රතිලාභීන්, තරගකරුවන්, ගොවීන් යනු, ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමෙහි ක්‍රියාකාරකම් කෙරෙහි අඩු බලයක් සහ ඉහළ උනන්දුවක් ඇති ඇතැම් පාර්ශවකරුවන් වන හෙයින් ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම විසින් තම ක්‍රියාකාරකම් පිළිබඳව මෙම පාර්ශවකරුවන් ද දැනුවත් කළ යුතු ය.

පාර්ශවකරුවන් පිළිබඳ කෙටි යෙදුම් ලැයිස්තුව	
AG	විගණකාධිපති
BOC	ලංකා බැංකුව
CEA	මධ්‍යම පරිසර අධිකාරිය
CEB	ලංකා විදුලිබල මණ්ඩලය
CPC	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
DMS	කළමනාකරණ සේවා දෙපාතර්මේන්තුව
GMOA	රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය
GoSL	ශ්‍රී ලංකා රජය
GT	සාමාන්‍ය වෙළඳාම
IRD	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
MoA	කෘෂිකර්ම අමාත්‍යාංශය
MoF	මුදල් අමාත්‍යාංශය
MOH	සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී
MOMCH	මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී
MT	නවීන වෙළඳාම
PED	රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව
RDHS	ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
SLR	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
SLSI	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

‘ශදුඅත’ විශ්ලේෂණය

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමෙහි මෙහෙයුම් ක්‍රියාකාරිත්වයේ පරිසරය තවදුරටත් අවබෝධ කර ගැනීම සඳහා, ‘ස්වොට්’ (SWOT) හෙවත් ‘ශදුඅත’ විශ්ලේෂණයක් සිදු කරන ලදී. මෙය, එහි අභ්‍යන්තර ශක්තීන් සහ දුර්වලතා මෙන්ම එහි බාහිර අවස්ථා සහ තර්ජන හඳුනා ගැනීම සඳහා ද කරන ලද අධ්‍යයනයකි.

ශක්තීන්

- ශක්තිමත් සන්නාම ප්‍රතිරූපය
- කර්මාන්තයේ පළපුරුද්ද සහ ප්‍රවීණත්වය
- රාජ්‍ය හිමිකාරිත්වය සහ අනුග්‍රහය
- රැකියා අවස්ථා උත්පාදකය
- දේශීය ගොවියා සවිබල ගැන්වීම
- බැංකු ණය ගැනීම් නොමැති වීම
- ආයතනික පාලනය
- රැකියා සුරක්ෂිතභාවය සහ සේවක තෘප්තිය
- වැඩි නිෂ්පාදන ධාරිතාව
- වෙනත් රාජ්‍ය ආයතනවලින් කෙරෙන සහය සේවා
- ස්වයං තිරසාර බව
- වාණිජ සන්නාම සඳහා වූ ප්‍රාථමික සන්නාමය තුළින් ශක්තිමත් වෙළඳ සන්නාමය ගොඩනැගීම
- රැකියා සුරක්ෂිතභාවය සහ තෘප්තිය මත රැකියා

දුර්වලතා

- ත්‍රිපෝෂ බෙදාහැරීමේ අකාර්යක්ෂමතා
- පර්යේෂණ හා සංවර්ධන පහසුකම් නොමැතිකම
- ගබඩා ඉඩ ප්‍රමාණවත් නොවීම
- නිෂ්පාදන නවතා දැමීම් සඳහා උපස්ථ සැලැස්මක් නොමැතිකම
- නිෂ්පාදන නවතා දැමීම්
- නිෂ්පාදන අකාර්යක්ෂමතා
- ඒකාබද්ධ පද්ධති විසඳුමක් නොමැතිකම
- පුළුල් කිරීමේ අරමුදල් නොමැතිකම
- තත්ව ප්‍රමිති සඳහා ප්‍රතීතනය නොමැති වීම
- මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ ගැටලු
- සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි සහ ප්‍රධාන කාර්ය දර්ශක නොමැතිකම
- ආරක්ෂිත තොග ගොඩනගා තබා ගැනීමක් නොමැති වීම
- ආයතනයේ දැක්ම පිළිබඳ ප්‍රකාශය වෙනස් කිරීම
- ඍජු අපනයන නොමැතිකම
- සන්නාම පිළිබඳ දැනුවත්භාවය නොමැතිකම
- විස්තාරණය සඳහා අරමුදල් නොමැතිකම

SWOT

තර්ජන

- සැපයුම්කරුවන් සීමිත වීම
- රජයේ ප්‍රතිපත්ති වෙනස්වීම්
- සැපයුම්කරුවන් අනුකූලතාව නොදැක්වීම
- අනපේක්ෂිත දේශගුණික විපර්යාස
- ඍජු හා වක්‍ර ආදේශක නිෂ්පාදනවලින් එල්ල වන දැඩි තරගය
- තරගකාරී නිෂ්පාදන සමඟ මිල වෙනස
- තරගකරුවන්ගේ වැඩි දෘශ්‍යතාව සහ අලෙවි ප්‍රයත්න
- වහා ආහාරය පිණිස සූදානම් ධාන්‍ය නිෂ්පාදනවලින් එල්ලවන තර්ජනය
- තරගකරුවන් සතු විවිධාංගීකරණය වූ නිෂ්පාදන කළඹ

අවස්ථා

- විභව යටිතල පහසුකම් සංවර්ධනය
- තත්ව ප්‍රමිති සඳහා ප්‍රතීතනය ලබා ගැනීම
- ඒකාබද්ධ පද්ධති විසඳුම
- ස්වයංක්‍රීය කිරීමේ හැකියාව
- නව නිෂ්පාදන සංවධර්නය
- පිටි සඳහා ආදේශකයක් ලෙස "සුපෝෂ" අලෙවි කිරීම
- වෙළෙඳපොළ පුළුල් කිරීමේ හැකියාව
- නිෂ්පාදන කළඹ ප්‍රවර්ධනය

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම විසින් ඉලක්කගත ප්‍රතිලාභීන් වෙත නොමිලයේ නිකුත් කරනු ලබන "ත්‍රිපෝෂ" නමින් හැඳින්වෙන සුබසාධන නිෂ්පාදනයක් සහ මූලික වශයෙන් අලෙවි නියෝජිත ජාලයක් හරහා සාමාන්‍ය ජනතාව වෙත අලෙවි කෙරෙන "සුපෝෂ" නම් ප්‍රතිසන්නාමගත වාණිජ නිපැයුමක් ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම නිෂ්පාදනය කරයි. එබැවින්, ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමෙහි ලාභ ලබන ව්‍යාපාරික අංශය එම සන්නාමය වන හෙයින්, මෙම විශ්ලේෂණය ප්‍රධාන වශයෙන් සිදු කරනු ලැබුවේ "සුපෝෂ" නිපැයුම වෙත අවධානය යොමු කරමිනි.

අධි

ආදේශකවල තර්ජනය

- ධාන්‍ය පදනම් කරගත් පුළුල් පරාසයක නිෂ්පාදන වෙළඳපොළෙහි තිබීම
- තරගකරුවන්ට සාපේක්ෂව තනි නිෂ්පාදනයක් පමණක් ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම විසින් නිෂ්පාදනය කිරීම
- උදෑසන ආහාරය සඳහා බොහෝ විකල්ප නිෂ්පාදන තිබීම
- වෙළඳපොළෙහි අඩු වියදම් විකල්ප නිෂ්පාදන තිබීම
- බත් ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආහාරය වීම

අවම

නව ප්‍රවේශකවල තර්ජනය

- කතිපයාධිකාරය
- අධි ප්‍රාග්ධන අවශ්‍යතා
- පරිමාණිය ආර්ථිකයන්
- සේවාදායක සන්නාම පක්ෂපාතිත්වය
- තරගකරු ප්‍රබල ස්ථානයක් පවත්වා ගැනීම
- නිශ්චිත රාජ්‍ය නීති රෙගුලාසි නොමැති වීම

අධි

සැපයුම්කරුගේ බලය

- බඩ ඉරිඟු සහ සෝයා සඳහා ආදේශක නොමැති වීම
- කෘෂි නිෂ්පාදන ප්‍රධාන අමු ද්‍රව්‍ය වීම
- අනපේක්ෂිත කාලගුණික රටා සැපයුම කෙරෙහි බලපෑම
- කිරි පිටි සඳහා එකම සැපයුම්කරු, මෙහෙයුම් වෙනුවෙන් භාවිතා කරන තෙල් සඳහා එකම සැපයුම්කරු
- නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා විශේෂිත අමතර කොටස් අවශ්‍ය වීම

මධ්‍යස්ථ

ගැනුම්කරුගේ බලය

- ත්‍රිපෝෂ සඳහා ගැනුම්කරු බලයක් නොමැති වීම
- කතිපයාධිකාරය නිසා ප්‍රභේදනය නොවූ නිෂ්පාදනවල පිරිවැය අඩුවෙන් මාරු වීම
- නවීන වෙළඳ ගනුදෙනුකරුවන් බලවත් වීම

ස්තුතිය...

අප දිරිමත් කරමින් නිරතුරු අපට මාර්ගෝපදේශකත්වය ලබා දුන් සෞඛ්‍ය අමාත්‍ය ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල මහතා, අප නිසි මගට යොමු කරමින් උපදෙස් ලබා දුන් එම අමාත්‍යාංශයේ ලේකම් ගරු එස්. ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත මහතා සහ අපට වාර්ෂිකව අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙමින් අතහිත දුන් මුදල් අමාත්‍යාංශයේ ලේකම් හා මහා භාණ්ඩාගාරයේ ලේකම් ගරු කේ. එම්. මහින්ද සිරිවර්ධන මහතාට අපගේ ස්තුතිය පුදකර සිටින්නෙමු.

එලෙසින්ම ආයතනයේ ප්‍රතිපත්තිමය තීරන ගැනීමේදි තම යුතුකම් හා වගකීම් නිසි ලෙස ඉටු කළ අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම මහත්ම, මහත්මීන්ගෙන් ලද සහාය අප සැමට ආශිර්වාදයක්ම විය. එමෙන්ම අපගේ සැපයුම්කරුවන් හා බාහිරව අපට සේවය සලසන සැම කෘතඥ පූර්වකව සිහිපත් කර සිටින්නෙමු.

අපගේ ආයතනයේ ඉහළ සිට පහළටත්, පහළ සිට ඉහළටත් ගලා යන ධූරාවලින් තෘප්තිමත්ව සේවය කරන කාර්ය මණ්ඩලයක් දක්නට ලැබීම ඉමහත් සතුටකි. ආයතනයේ දියුණුවට ඔවුන් ලබා දෙන දායකත්වය අගය කළ යුතුය. අවසන් වශයෙන් මෙම ඉලක්ක ජය ගැනිමට නිරතුරු වෙහෙසෙන ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ කළමනාකාරිත්වය ඇතළු සමස්ත කාර්ය මණ්ඩලයට ජයග්‍රහණයේ ප්‍රණාමය පුදකර සිටින්නෙමු.

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
ලාභය හෝ අලාභය පිළිබඳ ප්‍රකාශය
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන	31/12/2023 රු.	31/12/2022 රු.
ආදායම			
අයභාරය	02	5,340,097,463	1,460,376,665
අඩු කළා : භාවිතයට සූදානම් නිෂ්පාදනවල පිරිවැය	03	(4,434,494,806)	(1,397,887,498)
: විකුණුම් පිරිවැය	04	(27,747,095)	(16,306,385)
දළ ලාභය / (අලාභය)		877,855,562	46,182,781
වෙනත් ආදායම්	05	146,643,079	59,784,117
අඩු කළා : වියදම්			
විකුණුම් හා බෙදාහැරීමේ වියදම්	06	43,803,343	13,000,652
පරිපාලන වියදම්	07	89,310,178	95,195,285
මූල්‍ය සහ වෙනත් වියදම්	08	80,294,424	71,816,385
		213,407,945	180,012,321
බදු පූර්ව ශුද්ධ ලාභය / (අලාභය)		811,090,697	(74,045,423)
වර්ෂය සඳහා ආදායම් බද්ද - 2023	09	(255,684,180)	25,735,350
බදු පසු ශුද්ධ ලාභය / (අලාභය)		**555,406,517**	**(48,310,073)**

මෙම මූල්‍ය ප්‍රකාශයන්හි ඉතා වැදගත් කොටසක් වන පිටු අංක 6 සිට 30 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශ සඳහා සිදු කරන ලද සටහන් හා එක්ව ඉහත සඳහන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය කියවනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන	31/12/2023 රු.	31/12/2022 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	14	1,104,816,486	1,105,798,640
විලම්බිත බදු වත්කම්		15,385,245	35,888,296
ලැබීමට නියමිත ණය මුදල්	15	49,743,321	-
ජංගම වත්කම්			
වට්ටෝරු භාණ්ඩ	16	952,274,033	458,657,846
වෙළඳ සහ වෙනත් ලැබීම් නියමිත	17	347,217,913	182,545,806
මුදල් හා මුදල් සමාන දෑ	18	868,353,209	513,773,838
		2,167,845,155	1,154,977,490
මුළු වත්කම්		**3,337,790,207**	**2,296,664,426**
කොටස් හිමිකම් හා බැරකම්			
ප්‍රාග්ධනය හා සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	19	304,600,000	304,600,000
ප්‍රාග්ධන සංචිතය	20	407,750,516	407,750,516
ප්‍රත්‍යාගණන සංචිත	21	518,157,038	518,157,038
රඳවා ගත් ඉපැයුම්		1,064,046,112	605,989,851
මුළු කොටස් හිමිකම්		**2,294,553,666**	**1,836,497,405**
ජංගම නොවන බැරකම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	22	72,942,409	79,162,809
වෛද්‍යාධාර අරමුදල	23	314,226	435,786
		73,256,635	**79,598,595**
ජංගම බැරකම්			
විලම්බිත ආදායම	24	552,426,677	102,540,269
වෙළඳ සහ වෙනත් ගෙවීම් නියමිත	25	417,553,229	278,028,157
මුළු කොටස් හිමිකම් හා බැරකම්		**3,337,790,207**	**2,296,664,426**

ඉහත මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, මෙම මූල්‍ය ප්‍රකාශවල ඉතා වැදගත් අංගයක් සුසාදනය කරන පිටු අංක 06 සිට 30 දක්වා ගෙන හැර ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශවලට කරන ලද සටහන් හා සමග සංයෝජිතව කියවිය යුතු වන්නේ ය.

2007 අංක 07 දරන සමාගම් පනතේ නියමයන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කර ඇත.

....
මූල්‍ය ප්‍රධානී

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ..

මණ්ඩලය වෙනුවෙන් සහ ඒ උදෙසා අනුමත කර අත්සන් කරන ලදී.

....	....
සභාපති	**අධ්‍යක්ෂ**

ජා ඇල, කපුවත්ත.
දිනය : 22/03/2024

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

කොටස් හිමිකම් වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ප්‍රාග්ධන සංචිත	ප්‍රත්‍යාගණන සංචිත	රඳවා ගත් ඉපැයුම්	එකතුව
		රු.	රු.	රු.	රු.	රු.
2022.01.01 දිනට ශේෂය		304,600,000	407,750,516	511,096,168	656,621,192	1,880,067,876
එකතු කිරීම් / අඩු කිරීම් - 2022		-	-	7,060,870	-	7,060,870
ලාභාංශ		-	-	-	(20,000,000)	(20,000,000)
පූර්ව ගැළපුම්		-	-	-	17,678,732	17,678,732
බදු පසු ශුද්ධ ලාභය / (අලාභය) - 2022		-	-	-	(48,310,073)	(48,310,073)
2022.12.31 දිනට ශේෂය		**304,600,000**	**407,750,516**	**518,157,038**	**605,989,851**	**1,836,497,405**
2023.01.01 දිනට ශේෂය		304,600,000	407,750,516	518,157,038	605,989,851	1,836,497,405
ලාභාංශ		-	-		(65,000,000)	(65,000,000)
පූර්ව ගැළපුම්	26	-	-	-	(32,350,255)	(32,350,255)
බදු පසු ශුද්ධ ලාභය / (අලාභය) - 2023		-	-	-	555,406,517	555,406,517
2023.12.31 දිනට ශේෂය		**304,600,000**	**407,750,516**	**518,157,038**	**1,064,046,112**	**2,294,553,666**

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	31/12/2023	31/12/2022
	රු.	රු.
මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහ		
බදු පූර්ව ශුද්ධ ලාභය / (අලාභය)	811,090,697	(74,045,423)
ගැළපුම්		
ක්ෂය වීම්	89,048,731	64,146,588
පොලී ආදායම	(77,331,884)	(37,893,166)
වර්ෂය සඳහා පාරිතෝෂිත ප්‍රතිපාදනය	4,647,286	3,716,378
වෛද්‍යාධාර දායකත්ව ප්‍රතිපාදනය	208,740	221,340
පූර්ව වර්ෂ ගැළපුම්	(32,350,255)	9,276,426
	(15,777,381)	**39,467,566**
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය	795,313,315	(34,577,856)
කාරක ප්‍රාග්ධනයේ සිදුවූ වෙනස්කම්		
වෙළඳ හා වෙනත් ලැබීම් නියමිතවල වැඩිවීම / (අඩුවීම)	(214,415,428)	(64,678,090)
වෙළඳ හා වෙනත් ගෙවීම් නියමිතවල වැඩිවීම / (අඩුවීම)	(97,599,203)	(16,587,406)
වට්ටෝරු භාණ්ඩ වැඩිවීම / (අඩුවීම)	(493,616,188)	(143,914,304)
විලම්බිත ආදායම වැඩිවීම / (අඩුවීම)	449,886,408	102,540,269
	(355,744,411)	**(122,639,530)**
මෙහෙයුම් කටයුතු වලින් උත්පාදිත මුදල්	439,568,905	(157,217,386)
අඩු කළා : ගෙවන ලද පාරිතෝෂික	(5,561,625)	(3,244,400)
ගෙවන ලද ආදායම් බදු	(3,362,916)	-
ගෙවන ලද වෛද්‍ය ප්‍රතිලාභ	(330,300)	(219,499)
මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ	**430,314,063**	**(160,681,285)**
ආයෝජන කටයුතු		
දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ අත්කර ගැනීම	(88,066,577)	(7,243,936)
කෙටි කාලීන ආයෝජන	56,398,621	(46,180,196)
ලද පොලී	77,331,884	12,360,657
ආයෝජන කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ	**45,663,929**	**(41,063,476)**
මූල්‍ය කටයුතු		
ලාභාංශ ගෙවීම්	(65,000,000)	(10,000,000)
මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහ	(65,000,000)	(10,000,000)
මුදල් සහ මුදල් සමාන දෑ හී ශුද්ධ වැඩිවීම (අඩුවීම)	410,977,992	(211,744,761)
වසර ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ	128,744,869	340,489,630
ඉදිරියට ගෙන ගිය මුදල් සහ මුදල් සමාන දෑ	**539,722,861**	**128,744,869**
මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා ඇති මුදල් සහ මුදල් සමාන දෑ හී විශ්ලේෂණය		
ලංකා බැංකුව, ජා-ඇල ගිණුම් අංකය 71324617	258,291,873	76,633,346
ලංකා බැංකුව, ජා-ඇල ගිණුම් අංකය 80306903	281,410,988	52,111,523
සුළු මුදල්	20,000	-
	539,722,861	**128,744,869**

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

නිෂ්පාදන ගිණුම

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන	31/12/2023 රු.	31/12/2022 රු.
නිෂ්පාදන පිරිවැය			
අමු ද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍ය			
2023.01.01 දිනට ශේෂය		285,782,578	172,340,457
මිලදී ගැනීම්	10	2,209,374,406	1,185,651,849
ප්‍රදාන අමු ද්‍රව්‍ය	11	2,158,666,344	103,437,269
		4,653,823,328	1,461,429,576
වෙළෙඳ ගිණුමට මාරු කිරීම		-	(20,493,000)
දුබලතාවයට පත්වීම		(25,801)	-
2023.12.31 දිනට ශේෂය		(788,779,970)	(285,782,578)
පරිභෝජනය කළ අමුද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍යවල පිරිවැය		**3,865,017,556**	**1,155,153,998**
සෘජු ශ්‍රම හා කළමනාකරණ පිරිවැය	12	238,380,892	192,173,910
ප්‍රාථමික පිරිවැය		**4,103,398,449**	**1,347,327,907**
කම්හල් පොදුකාර්ය වියදම්	13	363,978,602	122,322,279
		4,467,377,051	**1,469,650,186**
කෙරෙමින් පවත්නා වැඩ			
2023.01.01 දිනට ශේෂය		36,129,610	15,072,093
2023.12.31 දිනට ශේෂය	16	(15,161,890)	(36,129,610)
		20,967,720	**(21,057,518)**
මුළු නිෂ්පාදන පිරිවැය		**4,488,344,771**	**1,448,592,669**

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන්

2023 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා

1. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1.1 වාර්තා කිරීමේ ආයතනය

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ආයතනය, පූර්ණ රජය සතු සමාගමක් ලෙස (රජය සතු ව්‍යවසායක් ලෙස) ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත කර පිහිටුවා ඇති, සෞඛ්‍ය අමාත්‍යාංශයේ (හෙවත් රේඛීය අමාත්‍යාංශයේ) අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන සීමිත වගකීමක් සහිත (2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව PB - 3873 යටතේ පවත්නා) සමාගමකි.

සමාගමේ ලියා පදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ශ්‍රී ලංකාවේ, ජා ඇල, කපුවත්ත, තැ.පෙ. අංක 17 යන ලිපිනයෙහි පිහිටා ඇත.

1.1.2 ප්‍රධාන කටයුතු සහ මෙහෙයුම්වල ස්වභාවය

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ''ත්‍රිපෝෂ බෙදාහැරීමේ වැඩසටහන'' සඳහා ''ත්‍රිපෝෂ'' නිෂ්පාදනය කරනු ලබන එකම සමාගම වනුයේ මෙම ආයතනයයි.

සමාගමේ වෙනත් ප්‍රධාන කාර්යයන් වූයේ :

- ශ්‍රී ලංකාව තුළ මාතෘ සහ ළමා මන්දපෝෂණය අඩු කිරීම සඳහා ශක්ති වර්ධක ශ්‍රී ලාංකික අතිරේක ආහාර නිෂ්පාදිතයක් වන ''ත්‍රිපෝෂ'' වැඩි දියුණු කිරීම, නිෂ්පාදනය සහ බෙදා හැරීම පිණිස පහසුකම් සැලසීම.
- ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා අමු ද්‍රව්‍ය සපයනු ලබන දේශීය ගොවීන් හැකි තාක් දුරට ආදායම් ජනනය වන මාර්ග සඳහා ධෛර්යමත් කිරීම.
- රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව, වෙනත් ආකාරයේ ශක්ති වර්ධක මිශ්‍ර කරන ලද ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කර අලෙවි කිරීම.
- වාර්ෂික ත්‍රිපෝෂ අවශ්‍යතාව පිළිබඳව ඇගයීමක් සිදු කර, එය සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

1.1.3 අධ්‍යක්ෂ මණ්ඩලය

1. දීප්ති කුලරත්න මහතා (සභාපති)
2. වෛද්‍ය අසේල ගුණවර්ධන මහතා
3. ආචාර්ය ලක්මිණී එන්. මාගොඩරත්න මහත්මිය
4. එච්. එම්. තේජා හේරත් මහත්මිය
5. චතුර්නික කේශංග පෙරේරා මහතා
6. ආචාර්ය චිත්‍රමාලි ද සිල්වා මහත්මිය
7. චමිලා කරුණාතිලක මහත්මිය (භාණ්ඩාගාර නියෝජිත)

නිරීක්ෂක

ඩී. සී. වික්‍රමසේන සුදත් කරුණාරත්න මහතා (ප්‍රධාන මූල්‍ය නිලධාරි - සෞඛ්‍ය අමාත්‍යාංශය)

මණ්ඩලයේ ලේකම්

තනුජා ප්‍රියදර්ශනි අල්විස් මහත්මිය

1.1.4 විගණක

ජාතික විගණන කාර්යාලය
අංක 306 / 72, පොල්දූව පාර, බත්තරමුල්ල.

1.1.5 බැංකුකරුවන්

ලංකා බැංකුව, ජා ඇල.

1.1.6 නිකුත් කිරීම සඳහා බලය ලත් දිනය

අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවට අනුව, 2023 දෙසැම්බර් මස 31 වන දිනට අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්හි මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම පිණිස අවසර ලබා දෙන ලදී.

1.1.7 පිළියෙළ කිරීමේ පදනම

සමාගමේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙළ කරනු ලැබ ඇත. සාධාරණ අගය මත ගැනෙන වටිනාකමින් මනිනු ලබන මූල්‍ය වත්කම් සහ වගකීම් හැර ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සඳහා ඇතැම් තීරණාත්මක ගිණුම් ඇස්තමේන්තු භාවිතා කිරීම අවශ්‍ය වේ. සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරමින් ඒවා යොදා ගැනීමේ ක්‍රියාවලියේ දී කළමනාකරණය සිය විනිශ්චයමතිය ක්‍රියාවට නැංවීමේ ද අවශ්‍ය වන්නේ ය. ඉහළ මට්ටමේ විනිශ්චයමතියක් අදාළ වන හෝ සංකීර්ණතාවයක් ඇතිවන ක්ෂේත්‍ර හෝ සමාගමේ මූල්‍ය ප්‍රකාශ සඳහා උපකල්පන සහ ඇස්තමේන්තු වැදගත් වන ක්ෂේත්‍ර මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කරනු ලැබ ඇත.

අ. අනුකූලතාව දැක්වීමේ ප්‍රකාශය

ගිණුම්කරණ ප්‍රතිපත්තීන්, පදනම් සහ සටහන් (''මූල්‍ය ප්‍රකාශ'') සමඟ විස්තීර්ණ ආදායම් හා වියදම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, සම කොටස්හි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සමන්විත මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි වරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සහ 2007 අංක 7 දරන සමාගම් පනතෙහි දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූලව ය.

ආ. නිර්ණය කිරීමේ පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ අගය සම්බන්ධයෙන් යෝග්‍ය අනාවරණය කිරීම් සිදු කරනු ලබන අවස්ථාවන්හි දී හැර, මෙම මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කරනු ලැබ ඇත.

ඇ. සංසන්දනාත්මක තොරතුරු

වර්තමාන කාල සීමාව තුළ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීමේ සහ අන්තර් කාල සීමා තුලනාත්මකභාවය ඉහළ නැංවීමේ අරමුණින්, එම මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති පෙර වර්ෂයේ සියලුම වටිනාකම් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක, විස්තරාත්මක සහ ව්‍යක්ත තොරතුරු ඇතුලත් සංසන්දනාත්මක තොරතුරු අනාවරණය කරනු ලැබේ.

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති, වෙනත් යම් අයුරකින් දක්වා ඇති අවස්ථාවක දී හැරුණු කොට, මෙම මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කර ඇති සියලුම කාල සීමාවන් සඳහා අඛණ්ඩව අදාළ කරගනු ලැබ ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශවල අන්තර්ගත විෂයයන්හි ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය කිරීම සංශෝධනය කරනු ලැබ ඇති අවස්ථාවක දී, මනා ඉදිරිපත් කිරීමක් සිදු කිරීම පිණිස වත්මන් වර්ෂය හා අනුකූල වීම සඳහා සංසන්දනාත්මක වටිනාකම් ද නැවත වර්ගීකරණයට ලක් කරනු ලැබ ඇත.

ඇ. කෘත්‍යාත්මක හා ඉදිරිපත් කරනු ලැබීමේ වලංගු මුදල

සමාගමේ කෘත්‍යාත්මක හා ඉදිරිපත් කරනු ලැබීමේ වලංගු මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබේ.

ඉ. ප්‍රධාන ඇස්තමේන්තු සහ වැදගත් තීන්දු භාවිත කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනුගත වූ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම මඟින් කළමනාකරණය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් හි ගිණුම්කරණ ප්‍රතිපත්ති වල භාවිතය හා වාර්තාගත වටිනාකම් කෙරෙහි බලපෑම් ඇති කරනු ලබන ස්වරූපයේ තීන්දු ගැනීම, ඇස්තමේන්තු සකස් කිරීම සහ පූර්ව නිගමනවලට එළඹීම අපේක්ෂා කෙරේ. තථ්‍ය ප්‍රතිඵල, මෙම ඇස්තමේන්තු වලින් සහ යොදා ගන්නා ලද නිගමනවලින් වෙනස් විය හැකි ය.

ඇස්තමේන්තු සහ පාදක කර ගත් පූර්ව නිගමන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තුව සංශෝධනය කරනු ලබන කාල සීමාව තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු වලට සිදු කරනු ලබන සංශෝධන හඳුනා ගනු ලබන්නේ, එම සංශෝධනය එම කාල සීමාව සඳහා පමණක් බලපාන්නේ නම් හෝ එකී සංශෝධනය වර්තමාන සහ අනාගත කාල සීමා දෙකටම බලපාන්නේ නම්, එම සංශෝධන කාල සීමාව සහ අනාගත කාල සීමාවන් තුළදී ය.

ඊ. ක්‍රියාත්මක ව්‍යාපාර තත්වය

නුදුරු අනාගත කාලය තුළ ක්‍රියාත්මක ව්‍යාපාරයක් වශයෙන් සමාගම නොකඩවා පවත්වාගෙන යාමට ඊට ඇති හැකියාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය තක්සේරුවක් කර ඇති අතර ස්වකීය මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදු කරගෙන යාමට අවශ්‍ය තරම් ප්‍රමාණවත් සම්පත් සමාගම සතුව පවතින බවට මණ්ඩලය සෑහීමට පත් වෙමින්, ඒ අනුව, සමාගම ක්‍රියාත්මක තත්වයේ පවත්වාගෙන යාමේ උපකල්පනය නුදුරු අනාගත කාල සීමාව තුළ නොකඩවා යොදා ගත හැකි බවට ද සහතික වෙයි.

1.2 වත්කම් සහ එම වත්කම් තක්සේරු කිරීමේ පදනම්

1.2.1 දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ

a. හඳුනා ගැනීම සහ මානනය කිරීම

දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ විෂයයන් පිරිවැය යටතේ හෝ සමුච්චිත ක්ෂය වීම් අඩු කරන ලද සාධාරණ අගය යටතේ සහ වෙනත් යම් දුබලතා අලාභ යටතේ දක්වා ඇත.

සියලුම දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ විෂයයන් මූලික වශයෙන් පිරිවැය යටතේ හෝ සමුච්චිත ක්ෂය වීම් අඩු කරන ලද පිරිවැය යටතේ සහ යම් දුබලතා අලාභ යටතේ වාර්තා කර ඇත. වත්කමක වැදගත් අංග හඳුනා ගෙන, වෙන වෙනම ක්ෂය කිරීම් සිදු කරනු ලැබේ. දේපළ, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණවල වැදගත් අංග අන්තර් කාලය තුළ ආදේශ කරනු ලැබීමට අවශ්‍ය වන්නේ නම්, ආයතනය විසින් එම ආදේශ කළ කොටස බැහැර කරන අතර, නව කොටසෙහිම ප්‍රයෝජ්‍ය ජීව කාලය සහ ක්ෂය වීම් සමඟ එම කොටස හඳුනා ගනු ලැබේ. අනෙකුත් සියලුම අලුත්වැඩියා කිරීමේ හා නඩත්තු කිරීමේ පිරිවැය පැන නඟිනු ලබන පරිදි, ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

ආ. පිරිවැය

දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණවල පිරිවැය, ඒවා මිලදී ගත් මිල සහ එයින් අපේක්ෂිත කාර්යය උදෙසා එම වත්කම ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම පිණිස සෘජුවම දරන ලද වෙනත් පිරිවැයෙන් සමන්විත වේ.

ඉපැයීමේ ධාරිතාව පවත්වාගෙන යාමේ හෝ ඉහළ නැංවීමේ අරමුණින්, ස්ථිර ස්වරූපයේ වත්කම් අත්පත් කර ගැනීම, දීර්ඝ කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරනු ලබන පසු කාලීන වියදම්, ප්‍රාග්ධන වියදම් සේ සලකනු ලැබ ඇත.

ප්‍රධාන පරීක්ෂා කිරීම් සහ පරීක්ෂා කිරීමේ වියදම් ඇතුලත්, වෙන් වෙන් වශයෙන් ගිණුම්ගත කරනු ලබන දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ යන එක් අංගයක් ආදේශ කිරීම සඳහා දරනු ලබන වියදම, ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. වෙනත් පසු කාලීන වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ, එම අංගයේ ඇතුලත් ඉදිරි ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමේ හැකියාවක් පවතී නම් සහ එහි පිරිවැය විශ්වාසදායක ලෙස ගණනය කළ හැකි නම් පමණි.

ඇ. ප්‍රත්‍යාගණනය කිරීම

තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේ දී ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ආයතනය සතු සියලුම වාර්තාගත දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ ප්‍රත්‍යාගණනය කරන ලදි.
(2020 වර්ෂයේ දී ලැබුණු එම තක්සේරු වාර්තාව අනුව සියලුම දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ 2020 වර්ෂයේ දී ප්‍රත්‍යාගණනයට ලක් කරන ලද අතර 2021 දෙසැම්බර් මස 31 වන දිනට අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශවල අදාළ ප්‍රත්‍යාගණන සංඛ්‍යා අනාවරණය කරනු ලැබ ඇත.)

ඈ. ක්ෂය කිරීම්

වත්කම්හි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ජීව කාලය මත එම වත්කම්හි පිරිවැය කපා හැරීම පිණිස, පහත සඳහන් වාර්ෂික වටිනාකම් යටතේ සරල මාර්ග පදනම (straight-line basis) මත, ලාභාලාභ ගිණුම වෙත ක්ෂය කිරීම් අයගත කරනු ලැබේ.

ගොඩනැගිලි	අවුරුදු 20 ට වැඩි
පිරියත සහ යන්ත්‍රෝපකරණ	අවුරුදු 10 ට වැඩි
මෝටර් රථ වාහන	අවුරුදු 05 ට වැඩි
උපකරණ හා මෙවලම්	අවුරුදු 05 ට වැඩි
විද්‍යාගාර උපකරණ	අවුරුදු 10 ට වැඩි
කෘෂිකාර්මික උපකරණ	අවුරුදු 10 ට වැඩි
විදුලි වැඩ	අවුරුදු 05 ට වැඩි
කාර්යාල උපකරණ	අවුරුදු 10 ට වැඩි
ලී බඩු සහ සවි කිරීම්	අවුරුදු 10 ට වැඩි
පරිගණක උපකරණ	අවුරුදු 04 ට වැඩි
අස්පෘශ්‍ය වත්කම්	අවුරුදු 04 ට වැඩි

වත්කම මිලදී ගත් මාසය සහ වත්කම් බැහැර කළ මාසය මත පදනම්ව, වෙන වෙනම සම්පූර්ණ අනුපාතයක් අනුව ක්ෂයවීම් අයගත කෙරේ.

ඉ. හඳුනා නොගැනීම

බැහැර කරන විට දී හෝ භාවිතයෙන් කිසිදු ඉදිරි ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරනු ලබන අවස්ථාවක දී, දේපළක, පිරියතක සහ යන්ත්‍රෝපකරණයක අංගයක් හඳුනා නොගනු ලැබූ සේ සැලකේ. වත්කම් හඳුනා නොගැනීම මත හිමි වන ඕනෑම ලාභයක් හෝ පාඩුවක්, එම හඳුනා නොගැනීම සිදු කරනු ලබන වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ ඇතුලත් කරනු ලැබේ.

1.2.2 කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ

කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ පිරිවැයෙහි දක්වනු ලැබේ. මෙම වියදම්, ප්‍රාග්ධනීකරණය විමට ඇති ගොඩනැගිලි ඉදි කිරීමේ දී සෘජුවම හට ගන්නා ප්‍රාග්ධන ස්වරූපයක වියදම් වේ. භාවිතයේ පවතින ප්‍රාග්ධනය, භාවිතය සඳහා ලබා ගත හැකි අවස්ථාවේ දී, අදාළ දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ වත්කම් වර්ගීකරණයට මාරු කරනු ලැබේ. එනම්, සමාගම විසින් අපේක්ෂිත අයුරින් ඒ සඳහා ක්‍රියාත්මක විමට හැකි ආකාරයෙන් එය පිහිටා ඇති අවස්ථාවේ දී සහ අවශ්‍ය තත්ත්වයෙන් පවතින අවස්ථාවේ දී ය. කෙරෙමින් පවතින ප්‍රාග්ධන වැඩ, යම් සමුච්චිත දුබලතා අලාභ අඩු කළ ණය ගැනුම් පිරිවැය ඇතුළත්ව, ගත් මිලට දක්වනු ලැබේ.

1.2.3 අස්පෘශ්‍ය වත්කම්

වත්කම වෙත ලැබෙන ඉදිරි ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමේ සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 38 අස්පෘශ්‍ය වත්කම්හි පරිදි, වත්කමෙහි පිරිවැය යථාර්ථවාදී ලෙස ඇගයීමේ හැකියාවක් පවතී නම්, එය අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගනු ලැබේ. ඒ අනුව, මෙම වත්කම්, සමුච්චිත ක්‍රමක්ෂය සහ යම් සමුච්චිත දුබලතා අලාභ අඩු කළ ගත් මිලට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සඳහන් කරනු ලැබේ.

පරිගණක මෘදුකාංග වර්ෂ 4 ක කාල සීමාවක් පුරා සරල මාර්ග ක්‍රමය මත ක්‍රමක්ෂය කර ඇත. වර්ෂ 4 ක කාල සීමාවක් පුරා සරල මාර්ග ක්‍රමය මත විෂය මාලා පරිපාටි සංවර්ධනය කිරීමේ පිරිවැය ලියා අස්කරනු ලැබේ.

1.2.4 වට්ටෝරු භාණ්ඩ ලේඛන

කල් ඉකුත් වූ සහ අඩු ක්‍රියාකාරී අයිතම සඳහා නිසි ඉඩ ලබා දීමෙන් අනතුරුව, සාමාන්‍ය පිරිවැය යටතේ වට්ටෝරු භාණ්ඩ ලේඛන ඇගයීම පළමුව පැමිණ පළමුව පිටවන පදනම (FIFO) මත සිදු කරනු ලැබේ. ලබා ගත හැකි ශුද්ධ වටිනාකම වනුයේ, සාමාන්‍ය වෙළෙඳපොළ තුළ, භාණ්ඩ ලේඛනය සකස් කිරීම අවසන් වූ පසු ඇස්තමේන්තුගත පිරිවැයට අඩු සහ විකිණීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය යටතේ වන මිලයි.

වට්ටෝරු භාණ්ඩ ලේඛන වත්මන් ස්ථානයට සහ තත්ත්වයට රැගෙන ඒමේ දී දරනු ලබන පිරිවැය, පහත සඳහන් සූත්‍ර භාවිත කරමින් ගිණුම් ගත කරනු ලැබේ :

අමු ද්‍රව්‍ය	- ගත් මිලට
කෙරෙමින් පවතින වැඩ	- ගත් මිලට
නිම කළ භාණ්ඩ	- සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය සහ සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාව මත පදනම් වූ ස්ථාවර නිෂ්පාදන පොදු කාර්ය සඳහා වූ සුදුසු ප්‍රතිශතයක් යොදා ගනු ලැබීමේ බර තැබූ සාමාන්‍ය / පිරිවැය අනුව.

ලබා ගත හැකි ශුද්ධ වටිනාකම වනුයේ, අදාළ නිමකිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය සහ විකිණීම සඳහා අවැසි ඇස්තමේන්තුගත පිරිවැය අඩු කළ සාමාන්‍ය වෙළෙඳ ක්‍රියාදාමය තුළ වන ඇස්තමේන්තුගත විකුණුම් මිලයි.

1.2.5 වත්කම් දුබලතාවයට පත්වීම

දුබලතාවයට පත්වීම පිළිබඳ යම් සඳහනක් වේ දැයි නිර්ණය කිරීම සඳහා සෑම වාර්තා කරනු ලබන දිනකදීම වත්කම්හි ධාරක ප්‍රවාහන පිරිවැය සමාලෝචනය කරනු ලැබේ. එවැනි සඳහනක් වුවහොත්, නැවත ලබා ගත හැකි වත්කම් ප්‍රමාණය ඇස්තමේන්තු කරනු ලැබේ. දුබලතාවයට අලාභයක් හඳුනා ගනු ලබන්නේ, යම් වත්කමක ප්‍රවාහන පිරිවැය හෝ මුදල් ජනනය කිරීමේ ඒකකය, එහි නැවත ලබා ගත හැකි ප්‍රමාණය ඉක්මවා යන්නේ නම් ය. නැවත ලබා ගත හැකි ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා භාවිත කරන ලද ඇස්තමේන්තුවල වෙනසක් සිදු වී ඇත්නම්, දුබලතා අලාභය ප්‍රතිවර්තනය කරනු ලැබේ.

1.2.6 මූල්‍ය වත්කම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 විෂය පථය යටතේ පවත්නා මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ, ණය සහ ලැබිය යුතු, කල් පිරීමට නියමිත ආයෝජන, විකිණීමට ඇති මූල්‍ය වත්කම් හරහා සාධාරණ අගයක් යටතේ වන මූල්‍ය වත්කම් ලෙස හෝ යෝග්‍ය පරිදි, ඵලදායී සීමාවක් තුළ සීමා කිරීමේ උපකරණ ලෙස සලකනු ලබන ව්‍යුත්පන්න ලෙස හෝ වර්ගීකරණය කරනු ලැබේ. සමාගම විසින් පළමු අවස්ථාවේදී ම, සිය මූල්‍ය වත්කම් වර්ගීකරණය පිළිබඳව නිර්ණය කරනු ලබයි.

සියලුම මූල්‍ය වත්කම් මූලිකවම සාධාරණ වටිනාකම් අතිරික්තය යටතේ හඳුනා ගනු ලබන්නේ, ගණුදෙනු පිරිවැය සඳහා සෘජුවම බලපෑම් කරනු ලබන, ලාභ හෝ අලාභ හරහා සාධාරණ ධන අගයක් යටතේ වත්කම් නොවනු ලබන අවස්ථාවක දී ය.

සමාගම විසින්, මුලින්ම ණය, ලැබිය යුතු දෑ සහ තැන්පතු ඒවා ආරම්භ වූ දිනය මත හඳුනා ගනු ලැබේ. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් (ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ දක්වා ඇති වත්කම් ඇතුලත්ව) මූලිකව හඳුනා ගනු ලබන්නේ, වෙළඳ ගිවිසුමෙහි ගිවිසුම්ගත විධිවිධාන සඳහා සමාගම විසින් පාර්ශ්වකරුවකු වනු ලබන වෙළඳ දිනයේ දී ය.

වත්කමකින් ලැබෙන මුදල් ප්‍රවාහ සඳහා ගිවිසුම්ගත අයිතීන් කල් ඉකුත් වූ විට, සමාගම විසින් එම මූල්‍ය වත්කම හඳුනා නොගෙන බැහැර කරනු ලබන අතර, එමඟින් මූල්‍ය වත්කම් මත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලබා ගැනීම උදෙසා, සාරානුකූලව මූල්‍ය වත්කමෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා දෙනු ලබන ගණුදෙණුවක් හරහා එම අයිතිය මාරු කරනු ලැබේ. සමාගම විසින් ඇති කරනු ලබන හෝ රඳවා තබා ගනු ලබන, පවරන ලද මූල්‍ය වත්කම්හි ඕනෑම පොලියක්, වෙන් වෙන් වශයෙන් වත්කමක් හෝ වගකීමක් සේ හඳුනා ගනු ලැබේ.

මූල්‍ය වත්කම් සහ වගකීම් හිලව් කිරීමක් කෙරෙන අතර, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ එම ශුද්ධ අගය ඉදිරිපත් කරනු ලබන්නේ,

එම අගයන් කපා හැරීමට සමාගම සතුව නෛතික අයිතියක් පවතින විට සහ ශුද්ධ පදනමක් මත නිරවුල් කිරීමට හෝ වත්කම අත්පත් කොට ගෙන, ඒ හා සමගාමීව වගකීම නිරවුල් කිරීමට අපේක්ෂා කරන්නේ නම් පමණකි.

සමාගමේ මූල්‍ය වත්කම් තුළ මුදල්, කෙටි කාලීන ආයෝජන, වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ ඇතුලත් වේ.

අ. ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ පවතින මූල්‍ය වත්කම්

ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ පවතින මූල්‍ය වත්කම් තුළ වෙළඳාම සඳහා දරන ලද මූල්‍ය වත්කම් සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ මූලික හඳුනා ගැනීම මත වර්ගීකරණයට ලක් කරන ලද මූල්‍ය වත්කම් ඇතුලත් වේ. මූල්‍ය වත්කම් වෙළඳාම සඳහා දරන ලද්දේ යයි වර්ගීකරණය කරනු ලබන්නේ, ආසන්නතම කාල සීමාව තුළ දී විකිණීමේ හෝ නැවත මිල දී ගැනීමේ අරමුණින්, එම වත්කම් අත්පත් කරගනු ලබන්නේ නම් ය.

ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ මූල්‍ය වත්කම්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය ආදායම හෝ මූල්‍ය වියදම තුළ හඳුනා ගනු ලබන සාධාරණ වටිනාකමෙහි වෙනස්කම් සමඟ සාධාරණ වටිනාකම යටතේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ දක්වාලනු ලැබේ.

සමාගම විසින් ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ මූලික හඳුනා ගැනීම මත කිසිදු මූල්‍ය වත්කමක් නම් කර වර්ගීකරණය කර නොමැත.

ආ. ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ යනු, ක්‍රියාකාරී වෙළඳපොළක් තුළ මතු කොට දක්වා නොමැති, ස්ථිර හෝ ලැබේ යයි සැලකිය හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික ඇගයීමෙන් අනතුරුව, හායන අඩු කර ඵලදායී පොලී අනුපාත (EIR) ක්‍රමවේදය භාවිත කරමින්, එවැනි මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැය යටතේ පසුව අගයනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ, අත්පත් කර ගැනීම මත ලද වට්ටම් හෝ අධි මිල සහ ඵලදායී පොලී අනුපාතයෙහි වැදගත් කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගැනීමෙනි. ඵලදායී පොලී අනුපාත ක්‍රමක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි සඳහන් මූල්‍ය ආදායම තුළ හඳුනා ගනු ලැබේ. දුබලත්වය හේතුවෙන් පැන නගින අලාභ, මූල්‍ය පිරිවැයෙහි සඳහන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

ලැබිය යුතු වෙළඳ ආදායම්, සේවක ණය, තැන්පතු, අත්තිකාරම්, වෙනත් ලැබිය යුතු සහ මුදල් සහ මුදල් සමාන දෑ ආදියෙන් ණය සහ ලැබිය යුතු ආදායම් සමන්විත වේ.

<u>සේවක ණය</u>
සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රධාන සේවක ණය දෙයාකාරයක් තිබේ.

i. සුභසාධක ණය - උපරිම මුදල රුපියල් 500,000/= කි. මුදල් ඇති බව පරීක්ෂා කිරීට යටත්ව, වසරකට 5.00% ක පොලී අනුපාතිකයක් අනුව උපරිම වසර පහකින් අයකර ගත හැක.
ii. ආපදා ණය - උපරිම මුදල රුපියල් 250,000/= කි. මුදල් ඇති බව පරීක්ෂා කිරමට යටත්ව, වසරකට 4.20% ක පොලී අනුපාතිකයක් අනුව උපරිම වසර පහකින් අයකර ගත හැක.

ඇ. කල් පිරීමට නියමිත ආයෝජන

ස්ථිර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහ ස්ථිර කල් පිරෙන තැන්පතු හා බැඳි ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්, සමාගම විසින් ධනාත්මක අදහසකින් පසු වන සහ කල් පිරෙන තෙක් ඒවා රඳවා තබා ගැනීමේ හැකියාව සමාගම සතු වූ විට, කල් පිරීමට නියමිත ආයෝජන ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මූලික ඇගයීමෙන් අනතුරුව, දුබලතා ඌණ ඵලදායී පොලී අනුපාත (EIR) ක්‍රමවේදය භාවිත කරමින්, එවැනි කල් පිරීමට නියමිත ආයෝජන ක්‍රමක්ෂය පිරිවැය යටතේ අගයනු ලැබේ. ඵලදායී පොලී අනුපාත ක්‍රමක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි සඳහන් මූල්‍ය ආදායම තුළ හඳුනා ගනු ලැබේ. දුබලත්වය හේතුවෙන් පැන නගින අලාභ, මූල්‍ය පිරිවැයෙහි සඳහන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

රජයේ සුරැකුම් පත්වල (භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර / ප්‍රති මිලදී ගැනුම් ගිවිසුම්) සහ ස්ථිර තැන්පතුවල කරනු ලබන ආයෝජන, කල් පිරීමට නියමිත ආයෝජන යටතේ වර්ගීකරණය කරනු ලැබ ඇත.

ඈ. විකිණීමට හැකි මූල්‍ය ආයෝජන

විකිණීමට හැකි ලෙස හෝ ඉහත සඳහන් මූල්‍ය වත්කම් වර්ගීකරණ කිසිවක් තුළ නම් කර වර්ගීකරණය කර නොමැති ව්‍යුත්පන්න නොවන

මූල්‍ය වත්කම්, විකිණීමට හැකි මූල්‍ය වත්කම් වේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව, එම වත්කම් සාධාරණ වටිනාකම හා එහි වෙනස්කම් අනුව අගයනු ලබන අතර, දුබලතා අලාභ හැර වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනා ගනු ලබන අතර, අරමුදල් සහ සංචිත වල තැන්පත් කර ඇති සාධාරණ වටිනාකමින් ඉදිරිපත් කරනු ලැබේ. විකිණීමට හැකි ණය සුරැකුම් මත පොලී ආදායම ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදය භාවිත කරමින් ගණනය කරනු ලබන අතර, ලාභ හෝ අලාභ තුළ හඳුනා ගනු ලැබේ. යම් ආයෝජනයක් හඳුනා ගනු නොලැබූ විට, අරමුදල් හා සංචිත තුළ සමුච්චිත ලැබීම් හෝ පාඩු, ලාභ හෝ අලාභ ගිණුමෙහි නැවත වර්ගීකරණය කරනු ලැබේ.

මූලික හඳුනා ගැනීම මත, සමාගම විසින් කිසිදු මූල්‍ය වත්කමක් විකිණීමට හැකි ආයෝජනයක් ලෙස නම් කර වර්ගීකරණය කරනු ලැබ නොමැත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 - මූල්‍ය උපකරණ

මූල්‍ය මෙවලම් යන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 වෙනුවට මූල්‍ය මෙවලම් යන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 ආදේශ වේ: වර්ගීකරණය සහ මානනය කිරීම, දුබලත්වයට පත්වීම වීම සහ ප්‍රාචීකරණ (හෙජ්) ගිණුම්කරණය යන මූල්‍ය මෙවලම් සඳහා වූ අංශත්‍රයම එකට ගෙන එමින් 2018 ජනවාරි මස 1 වන දිනයට හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික කාල සීමාවන් සඳහා හඳුනා ගැනීම සහ මානනය කිරීම.

සමාගම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 සම්මත කර ගත්තේ සම්පූර්ණ අතීතානුසාරී ක්‍රමය භාවිතා කරමිනි. සිදු කරන ලද තක්සේරුව මත පදනම්ව, සමාගමේ මූල්‍ය ප්‍රකාශවලට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 විශාල බලපෑමක් ඇති නොකරන බව සමාගම නිගමනය කර ඇත.

වර්ගීකරණය සහ මානනය කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 යටතේ, වෙළඳ ලැබිය යුතු මුදල් හැර, සමාගම ආරම්භක අවස්ථාවේ දී මූල්‍ය වත්කමක් මනිනු ලබන්නේ එහි සාධාරණ අගයට ය. ඊට අමතරව මානනයක් සිදු කෙරෙනුයේ, ලාභ හෝ අලාභ සහ ගනුදෙනු පිරිවැය හරහා සාධාරණ අගය මත ගණනය නොවූ මූල්‍ය වත්කම් සම්බන්ධයෙනි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 යටතේ, ණය මූල්‍ය මෙවලම්, ලාභ හෝ අලාභය හරහා සාධාරණ අගයක් මතත්, ක්‍රමක්ෂය කළ පිරිවැය හෝ වෙනත් විස්තීරණ ආදායම හරහා වූ සාධාරණ අගයක් මතත් පසු අවස්ථාවක දී මනිනු ලැබේ. මෙම වර්ගීකරණය, නිර්ණායක දෙකක් මත පදනම් වේ. එනම්, වත්කම් කළමනාකරණය සඳහා වූ සමාගමේ ව්‍යාපාර ආකෘතිය මත: සහ මෙවලම්වල කොන්ත්‍රාත්තුමය මුදල් ප්‍රවාහයන්, පරිශේෂව ඇති ''මුල් මුදල මත මුල් මුදල හා පොලී මුදල පමණක් වූ ගෙවීම්'' නියෝජනය කරන්නේ ද යන්න මත.

2018 ජනවාරි මස 1 වන දින මූලික අයදුම් කිරීමේ දිනය වන විට ආයතනයේ ව්‍යාපාර ආකෘති තක්සේරුව සිදු කරන ලද අතර, පසුව, එය, 2018 ජනවාරි මස 1 වන දිනට පෙර හඳුනා නොගත් මූල්‍ය වත්කම් සඳහා අතීතයට ද බලපාන පරිදි යොදන ලදී. ණය මෙවලම් මත කොන්ත්‍රාත් ගත මුදල් ප්‍රවාහයන්හි තක්සේරු කිරීම, හුදෙක් මූලික මුදල හා පොලී මුදල්වලින් පමණක් සමන්විත වන්නේ ද යන්න පදනම් වූයේ, වත්කම්වල ආරම්භක හඳුනා ගැනීමේ දී ඇති කරුණු සහ තත්වයන් මත ය.

සමාගමේ මූල්‍ය වගකීම් සඳහා වූ ගිණුම්කරණය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 යටතේ පැවති ආකාරයටම බොහෝ දුරට පවතී.

1.2.7 මූල්‍ය වත්කම් දුබලත්වයට පත්වීම

සමාගම විසින් සෑම වාර්තා කරනු ලබන දිනකදීම, මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් දුබලත්වයට පත්වී ඇති බවට හරයාත්මක සාක්ෂි පවතීදැයි අගයනු ලබන අතර, එවැනි දුබලත්වයක් සිදු වී ඇත්නම්, එම දුබල වී ඇති ප්‍රමාණය ගණනය කරනු ලබන්නේ, වත්කම් දැරීමේ වටිනාකම සහ ඇස්තමේන්තු ගත ඉදිරි මුදල් ප්‍රවාහයේ වත්මන් වටිනාකම අතර වෙනස ලබා ගනිමිනි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 9 සම්මත කිරීම මගින්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 තුළ පැවති සිදු වූ අලාභ ආශ්‍රිත ප්‍රවේශය වෙනුවට ඉදිරි දැක්මක් සහිත අපේක්ෂිත ණය අලාභ ප්‍රවේශයක් ප්‍රතිස්ථාපනය වීමෙන් මූල්‍ය වත්කම් සඳහා වූ දුබලතා අලාභ පිළිබඳ සමාගමේ ගිණුම්කරණය මූලික වශයෙන් වෙනස් කරනු ලැබ ඇත.සියලුම ණය සහ අනෙකුත් ණය මූල්‍ය වත්කම් වෙනුවෙන් ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගය මත පවත්වා නොගැනෙන අපේක්ෂිත ණය අලාභ සඳහා යම් ඉඩ හැරීමක් සටහන් කර තැබීමට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 9 නියම කරයි.

අපේක්ෂිත ණය අලාභ පදනම් වනුයේ, කොන්ත්‍රාත්තුවට අනුව ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ සහ ආයතනය වෙත ලැබෙතැයි අපේක්ෂා කරන සියලුම මුදල් ප්‍රවාහ අතර වෙනස මත ය. කිසියම් අඩුවක් ඇත්නම්, එය, වත්කම්වල මුල් ඵලදායී පොලී අනුපාතයට ආසන්න වන පරිදි පසුව වට්ටම් කරනු ලැබේ.

වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ සඳහා ප්‍රමිතයේ සරල ප්‍රවේශය ආයතනය විසින් යොදා ගනු ලැබිය යුතු අතර අපේක්ෂිත ණය අලාභ, ඒවායේ ආයු කාලය තුළ අපේක්ෂිත ණය අලාභ මත පදනම්ව ගණනය කළ යුතු වන්නේ ය.

1.2.8 මුදල් හා මුදල් සාමානයන්

අතැති මුදල්, බැංකු තැන්පතු, ස්ථාවර තැන්පතු සහ නැවත මිලදී ගැනීමේ ගිවිසුම් යනාදියෙන් මුදල් සහ මුදල් සාමානයන් සමන්විත වේ.

1.3 වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලබන වගකීම් වනුයේ, ඉල්ලීම මත හෝ වාර්තා කරනු ලබන දින සිට එක් වර්ෂයක් තුළ ගෙවීම සඳහා හිඟ ලෙස පවතිනු ලබන ශේෂයන් ය. වාර්තා කරනු ලබන දින සිට එක් වර්ෂයකට පසු ගෙවීම සඳහා හිඟ ලෙස පවතිනු ලබන ශේෂයන් ජංගම නොවන වත්කම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී, දත් සියලුම වගකීම් සලකා බලනු ලැබේ. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස නෛතික හෝ සාධනීය වගකීමක් සමාගම සතුවන අවස්ථාවේ දී, ප්‍රතිපාදන සහ වගකීම් හඳුනා ගනු ලබන අතර, මෙම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලා යාමක් අවශ්‍ය වනු ඇත.

1.3.1 සේවක ප්‍රතිලාභ

අ. විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

ශ්‍රී ලංකා ගිණුම්කරණ 19 යන සේවක ප්‍රතිලාභ ප්‍රමිතය සමාගම විසින් අනුගමනය කරනු ලැබ ඇති අතර සමාගමේ විශ්‍රාම ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකමට විශ්වාසදායක ඇස්තමේන්තුවක් සිදු කිරීම සඳහා ව්‍යාපෘති ඒකක ණය ක්‍රමය භාවිතා කර ඇත.

මෙම ප්‍රතිපාදන ගණනය කිරීමේදී භාවිත කරනු ලබන මූලික පූර්ව නිගමන තුළ පහත දැක්වෙන කරුණු ඇතුලත් වේ :

වට්ටම් අනුපාතය	**08%**
ඉදිරි වැටුප් වැඩිවීම් අනුපාතය	**10%**
කාර්ය මණ්ඩල පිරිවැටුම	**02%**
විශ්‍රාම ගැනීමේ වයස	අවුරුදු **60**

සමාගම ක්‍රියාත්මක තත්වයේ ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යනු ඇත.

ආ. නිශ්චිත දායකත්ව සැලැස්ම

නිශ්චිත දායකත්ව සැලැස්ම පශ්චාත් සේවා නියුක්ති සැලැස්මක් වන අතර, ඒ යටතේ ආයතනයක් විසින් වෙනත් යම් ආයතනයක් වෙත ස්ථිර දායකත්වයක් ගෙවනු ලබන අතර, අමතර වටිනාකමක් ගෙවීම සඳහා ඊට කිසිදු නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් හිමි නොවනු ඇත. නිශ්චිත දායකත්ව සැලැස්ම සඳහා වන දායකත්ව වෙනුවෙන් වන වගකීම්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හිඟ ලෙස පෙන්නුම් කෙරෙන පරිදි සහ ඒවා නියමිත වන්නා වූ අවස්ථාවන්හි දී එම ප්‍රකාශයෙහි වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

ඇ. සේවක අර්ථසාධක අරමුදල

එක් එක් සේවකයකුගේ වැටුප මත සමාගම සහ සේවකයා විසින් පිළිවෙළින්, 15% හා 10% බැගින් වන පරිදි, 2019 වර්ෂයේ අගෝස්තු මාසයේ සිට ඉදිරියට සිය දායකත්වය අනුමත කරන ලද අර්ථසාධක අරමුදල වෙත සලසා දෙනු ලැබේ. (පෙර පැවති අනුපාත - සමාගම සහ සේවකයින්, පිළිවෙළින් 12% සහ 8% කින් දායක විය.)

ඈ. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් විසින් එක් එක් සේවකයකුගේ වැටුප මත 3% ක් වූ ප්‍රමාණයක් අනුව සේවා නියුක්තයන්ගේ භාර අරමුදල වෙත සිය දායකත්වය සලසා දෙනු ලැබේ.

1.3.2 වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ

වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ ගත් මිල මත සඳහන් කරනු ලැබේ.

1.3.3 බදුකරණය

2017 අංක 24 දරන දේශීය ආදායම් පනත 2018.04.01 වන දින සිට බලපැවැත්වෙන පරිදි පාර්ලිමේන්තුව විසින් පනවනු ලැබ ඇත. ආයතනික ආදායම් බදු සඳහා වන ප්‍රතිපාදන, මූල්‍ය ප්‍රකාශයන්හි වාර්තා කරනු ලැබ ඇති ආදායම් හා වියදම් මූලාංගයන් මත පදනම් වන අතර 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදන වලට හා ඊට ඉන් පසුව සිදු කෙරෙන සංශෝධන අනුව ආදායම් බදු ආගණනය කෙරේ.

එකතු කළ අගය මත බද්ද (වැට් බද්ද), 2002 අංක 14 පනත මගින් හඳුන්වා දී ඇති අතර එය, 2002 අගෝස්තු මස 1 වන දින සිට බලාත්මක වේ. එකතු කළ අගය මත බදු පනතට අනුව, සාමාන්‍ය අපනය විකුණුම් මත වැට් බදු ගෙවීමට සමාගම බැඳී සිටී.

1.3.4 විලම්බිත බදුකරණය

විලම්බිත බද්ද සම්පාදනය කරනු ලබන්නේ, වත්කම් සහ වගකීම්වලට අයත් බදු පදනම්හි සහ අදාළ මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වාර්තා කරන දිනයේ දී එකී වත්කම් සහ වගකීම්වල පවත්නා ඉදිරියට රැගෙන යන අගය අතර තාවකාලික වෙනස්කම් මත පිහිටා වගකීම් ක්‍රමවේදය භාවිතා කරමිනි.

1.3.5 ප්‍රාග්ධන වගකීම් හා අවිනිශ්චිත වගකීම්

අවිනිශ්චිත වගකීම් යනු, ආර්ථික ප්‍රතිලාභ පැවරීම සිදු කළ නොහැකි හෝ නිසියාකාරව ගණනය කළ නොහැකි අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන වගකීම් වලින් පමණක් පැවැත්ම සහතික කරනු ලැබිය හැකි වගකීම් ය.

මූල්‍ය ප්‍රකාශවලට සිදු කරන අදාළ සටහන්හි සමාගමේ ප්‍රාග්ධන වගකීම් සහ අවිනිශ්චිත වගකීම් අනාවරණය කරනු ලැබේ.

1.4 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

ප්‍රාග්ධන සංචිතය (ප්‍රාග්ධන ප්‍රදානවලට අදාළව)

වර්ෂ 2011 සිට සෞඛ්‍ය අමාත්‍යාංශය, කෙයා (CARE) ආයතනය සහ ශ්‍රී ලංකා දුම්කොළ සමාගම විසින් ස්ථිර වත්කම් මත වැය කරන ලද අරමුදල්, ප්‍රාග්ධන ප්‍රදාන ලෙස සලකනු ලැබ ඇති අතර, ඒ අනුව, වර්ෂය සඳහා සමස්ත ක්ෂය කිරීම් සඳහා හිලව් කිරීම සිදු කරමින්, මෙම විෂයන්ට අදාළ ක්ෂය කිරීම් අදාළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්වලට ඇතුලත් කරනු ලැබ ඇත.

1.4.1 විලම්බිත ආදායම් - ප්‍රදාන සහ සහනාධාර

යම් ප්‍රදානයක් ලැබෙන බවට සහ ඊට යාකොට ඇති කොන්දේසි හා අනුගත වනු ඇති බවට සාධාරණ සහතිකවීමක් පවතින අවස්ථාවක දී රජයේ ප්‍රදාන හඳුනා ගනු ලැබේ. ප්‍රදානය වියදම් අයිතමයකට අදාළ වන විට, එකී ප්‍රදානය, ඊට වන්දි ගෙවීමට අදහස් කරන පිරිවැයට ක්‍රමානුකූල පදනමක් මත ගැළපීම සඳහා අවශ්‍ය කාල සීමාව තුළ ආදායමක් ලෙස හඳුනා ගැනේ. එකී ප්‍රදානය වත්කමකට අදාළ වන විට, එය විලම්බිතු ආදායමක් ලෙස හඳුනා ගෙන අදාළ වත්කමේ අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයු කාලය තුළ සමාන ප්‍රමාණවලින් ආදායම වෙත මුදා හරිනු ලැබේ.

වෙනත් වචන වලින් කිවහොත්, දරන ලද වියදම් සඳහා සමාගමට වන්දි සලසා දෙනු ලබන ප්‍රදාන, වියදම් හඳුනා ගනු ලබන කාල සීමාව තුළ ම විස්තිරණ ආදායම් ප්‍රකාශය / ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ ආදායම ලෙස හඳුනා ගනු ලැබේ. යම් වත්කමක පිරිවැය වෙනුවෙන් සමාගම වෙත වන්දි සලසා දෙනු ලබන ප්‍රදාන, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

සමාගමට මූල්‍ය නොවන ප්‍රදාන ලැබෙන විට, වත්කම් සහ ප්‍රදාන නාමික ප්‍රමාණවලින් දළ වශයෙන් සටහන් කර, ඊට පාදක වූ වත්කම්වල ප්‍රතිලාභය සමාන වාර්ෂික වාරිකවලින් ඒවායේ අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයු කාලය සහ පරිභෝජන රටාව මත ලාභ හෝ අලාභ ප්‍රකාශය වෙත මුදා හරිනු ලැබේ.

1.4.2 වියදම්

අ. දරන ලද පිරිවැය සහ සුවිශේෂී ආදායම් වර්ග ඉපැයීම් අතර ඍජු සබඳතාව මත පදනම්ව, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ වියදම් හඳුනා ගනු ලැබේ. සමාගමෙහි මෙහෙයුම් කටයුතු පවත්වා ගෙන යාමේ දී සහ එහි ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂම තත්වයකින් නඩත්තු කිරීමේ දී දරනු ලබන සියලූ වියදම්, වර්ෂය සඳහා අතිරික්තය ගණනය කිරීමේ දී ආදායම් එල්ලේ අයගත කරනු ලැබ ඇත.

1.4.3 මූල්‍ය වියදම් / ආදායම්

ආයෝජනය කරන ලද අරමුදල් සඳහා උපචිත පදනම මත ලද පොලියෙන් මූල්‍ය ආදායම සමන්විත වේ.

1.5 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය 07 හා අනුගතව සකස් කරනු ලැබ ඇත.

1.6 වාර්තා කිරීමේ කාල සීමාවෙන් පසුව සිදුවීම්

වාර්තා කිරීමේ කාල සීමාවෙන් පසුව මූල්‍ය ප්‍රකාශ තුළ ගැළපුම් හෝ අනාවරණ අවශ්‍ය වන්නා වූ සැලකිය යුතු සිදුවීම් කිසිවක් නොමැත.

1.7 නව ගිණුම්කරණ ප්‍රමිතීන්, සංශෝධන සහ අර්ථකථන

මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති, 2018 ජනවාරි මස 1 වන දින සිට බලපැවැත්වෙන නව ප්‍රමිතීන් අනුගමනය කිරීමට හැර, පෙර මූල්‍ය වර්ෂය තුළ සමාගමේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී අනුගමනය කළ ප්‍රතිපත්තිවලට අනුකූල වේ. දැනටමත් නිකුත් කරනු ලැබ ඇති නමුත් මේ දක්වා බලාත්මක නොවන වෙනත් යම් ප්‍රමිතියක්, අර්ථකථනයක් හෝ සංශෝධනයක් සමාගම විසින් සම්මත කර ගනු ලැබ නොමැත.

(i) “මූල්‍ය මෙවලම් : හඳුනා ගැනීම සහ මානනය කිරීම“ යන ශ්‍රී ලංකා ගිණුම්කරණ අංක 39 දරන ප්‍රමිතියෙහි බහු වර්ගීකරණ සහ මිනුම් ආකෘතීන් වෙනුවට මූලින් වර්ගීකරණ කාණ්ඩ දෙකක් පමණක්, එනම්, ක්‍රමක්ෂගත පිරිවැය සහ සාධාරණ අගය යනුවෙන් පැවති තනි මාදිලියක් සහිත ශ්‍රී ලංකා ගිණුම්කරණ අංක 9 යන “මූල්‍ය මෙවලම්“ ප්‍රමිතිය ප්‍රතිස්ථාපනය වේ.

(ii) භාණ්ඩ හා සේවා සඳහා වන කොන්ත්‍රාත්තු ආවරණය කරන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය 18 සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු ආවරණය කරන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය 11 වෙනුවට “ගනුදෙනුකාර භවතුන් සමග ගිවිසුම්වලින් ලැබෙන ආදායම“ යන ශ්‍රී ලංකා ගිණුම්කරණ අංක 15 දරන ප්‍රමිතිය ආදේශ වන්නේ ය. නව ප්‍රමිතිය පදනම් වී ඇත්තේ, භාණ්ඩයක හෝ සේවාවක පාලනය ගනුදෙනුකරුවකු වෙත පවරනු ලබන විට ආදායම හඳුනා ගැනීම යන මූලධර්මය මත ය. එබැවින් පාලනය පිළිබඳ සංකල්පය දැනට පවතින අවදානම් සහ ත්‍යාග පිළිබඳ සංකල්පය ප්‍රතිස්ථාපනය කරයි.

(iii) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය 1, එනම්, 'ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ප්‍රථම වරට අනුගමනය කිරීම', ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය 7, එනම්, 'මූල්‍ය මෙවලම් හෙළිදරව් කිරීම්' සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය 19, එනම්, 'සේවක ප්‍රතිලාභ' සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය 10, එනම්, 'ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ' සඳහා සිදු කරන ලද නව දුරටත් අදාළ නොවන සංශෝධන මගින් සංක්‍රාන්ති විධිවිධාන ආවරණය කරමින් අදාළ කෙටි කාලීන නිදහස් කිරීම් ඒ හරහා කපා හරියි.

(iv) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය 16 එනම්, “කල් බදු“, මූලික වශයෙන් බදුලාභීන් විසින් සිදු කරනු ලබන ගිණුම්කරණයට බලපානු ඇති අතර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය මත කල්බදුකර සියල්ලම පාහේ හඳුනා ගැනීමට එය හේතු වනු ඇත. ප්‍රමිතිය මගින් මෙහෙයුම් සහ මූල්‍ය කල් බදු අතර වත්මන් වෙනස ඉවත් කරන අතර වත්කමක් (කල් බදු දෙන ලද අයිතමය භාවිතා කිරීමේ අයිතිය) හඳුනා ගැනීමත්, අත්‍යන්ත වශයෙන් සියලුම කල් බදු කොන්ත්‍රාත්තු සඳහා කුලී ගෙවීම හා සම්බන්ධ මූල්‍ය වගකීමත් එමගින් අවශ්‍ය වේ. කෙටි කාලීන සහ අඩු වටිනාකමින් යුත් කල් බදු සඳහා විකල්ප නිදහස් කිරීම් පවතී.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය 16 මගින් කල් බදු හඳුනා ගැනීම, මැනීම, ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම සඳහා වන මූලධර්ම ගෙන හැර දක්වා ඇති අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 17 යටතේ, 'අඩු වටිනාකමක්' සහිත සහ මාස 12 හෝ ඊට අඩු බදු කාල සීමාවක් සහිත කෙටි කාලීන කල් බදු සඳහා වන නිදහස් කිරීම් කිහිපයක් හැර, මූල්‍ය කල් බදු සඳහා වූ ගිණුම්කරණයට සමාන තනි ශේෂ පත්‍ර ආකෘතියක් යටතේ සියලුම කල් බදු සඳහා බදුලාභීන් විසින් ගිණුම්ගත කිරීම් සිදු කරනු ලැබීම අවශ්‍ය වන්නේ ය. මෙම ප්‍රමිතිය 2019 ජනවාරි මස 01 වන දින හෝ ඉන් පසුව ඇරඹෙන වාර්ෂික කාල සීමාවන් සඳහා ක්‍රියාත්මක වේ.

(v) කොටස් ලෙස වර්ගීකරණය කරන ලද මූල්‍ය මෙවලම් මත ලාභාංශවලින් උද්ගත වන ආදායම් බදු ප්‍රතිවිපාක හඳුනා ගත යුත්තේ, බෙදා හැරිය හැකි ලාභ උත්පාදනය කළ අතීත ගනුදෙනු හෝ සිදුවීම් අනුව හඳුනා ගනු ලැබූ කල්හි බව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12 වන “ආදායම් බදු“ ප්‍රමිතියෙහි සංශෝධන මගින් පැහැදිලි කරයි. අදාළ ප්‍රමිතිය අළලා කළ වැඩි දියුණු කිරීම් 2019 ජනවාරි මස 1 වන හෝ ඊට පසුව ආරම්භ වන ගිණුම්කරණ කාල සීමාවන් සඳහා ක්‍රියාත්මක වේ.

(vi) යම් අදාළ සුදුසුකම් ලැබීමේ වත්කමක් එහි අපේක්ෂිත භාවිතය සඳහා හෝ විකිණීම සඳහා සූදානම් වූ පසු කිසියම් නිශ්චිත

ණය ගැනීමක් නොගෙවා ශේෂව පවතී නම්, එය සාමාන්‍ය ණය ගැනීම්වල කොටසක් බවට පත් වන බව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත23 වන "ණය ගැනීමේ පිරිවැය" අළලා කරන ලද සංශෝධන මගින් පැහැදිලි කරයි. අදාළ ප්‍රමිතියේ වැඩිදියුණු කිරීම් 2019 ජනවාරි මස 1 වන දිනට හෝ ඊට පසුව ආරම්භ වන ගිණුම්කරණ කාල සීමාවන් සඳහා ක්‍රියාත්මක වේ.

(vii) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය 3, එනම්, "ව්‍යාපාර සංයෝජිතය" යන්නට කළ සංශෝධන මගින් පැහැදිලි කර ඇත්තේ, ඒකාබද්ධ මෙහෙයුමක් වන ව්‍යාපාරයක පාලනය ලබා ගැනීම අදියර වශයෙන් සාක්ෂාත් කර ගන්නා ව්‍යාපාරික සංයෝජනයක් බවයි. ප්‍රමිතියේ වැඩි දියුණු කිරීම් 2019 ජනවාරි මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන ගිණුම්කරණ කාල සීමාවන් සඳහා ක්‍රියාත්මක වේ.

1.8 විකිණීම සඳහා තබා ගන්නා ලද ජංගම නොවන වත්කම්

නිරන්තර භාවිතය හරහා නොව මූලිකව, බැහැර කිරීම මඟින් නැවත ලබා ගැනීමට අපේක්ෂිත ජංගම නොවන වත්කම්, විකිණීම සඳහා තබා ගන්නා ලද වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. විකුණුම සඳහා තබා ගන්නා ලද වත්කම් ලෙස වර්ගීකරණය කිරීමට ප්‍රථම වහාම, සමාගමෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනුගතව යමින් මෙම වත්කම් නැවත ගණනය කරනු ලැබේ. ඉන් පසුව, එම වත්කම්හි වටිනාකමට අඩු වටිනාකම සහ විකුණුම් පිරිවැය අඩු කරන ලද සාධාරණ වටිනාකම යටතේ එම වත්කම් ගණනය කරනු ලැබේ. විකිණීම සඳහා තබා ගන්නා ලද, මූලික වර්ගීකරණය කිරීම මත හායන පාඩු සහ නැවත ගණනය කිරීම මත ලද පසු කාලීන ලැබීම් හෝ පාඩු, ලාභ හෝ අලාභ තුළ හඳුනා ගනු ලැබේ. කිසිම් හෝ සමුච්චිත හායන පාඩුවක් ඉක්මවා ලැබීම් හඳුනා ගනු නොලැබේ.

1.9 සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ආයතනයට අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක ආශ්‍රිත විශ්ලේෂණය

ඉලක්ක 2 : ශුන්‍ය කුසගින්න :
කුසගින්න නිමා කිරීම, ආහාර සුරක්ෂිතතාව අත් කර ගැනීම සහ පෝෂණය වැඩි දියුණු කිරීම සහ තිරසාර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම.

2.1 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය :
2030 වසර වන විට, කුසගින්න නිමා කර, සියලුම මිනිසුන්ට, විශේෂයෙන්, දුප්පතුන්ට සහ ළදරුවන් ඇතුළු අවදානමට ලක්විය හැකි තත්වයන් තුළ සිටින පුද්ගලයින්ට, වසර පුරා ආරක්ෂිත, පෝෂ්‍යදායී සහ ප්‍රමාණවත් ආහාර සඳහා ප්‍රවේශය සහතික වීම.

2.1.1 දර්ශකය :
මන්දපෝෂණය පැතිරීම.

2.2 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය :
2030 වසර වන විට, වයස අවුරුදු 5 ට අඩු ළමුන්ගේ වර්ධනය බාලවීම සහ මන්දනය පිළිබඳව ජාත්‍යන්තර වශයෙන් එකඟ වූ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම ඇතුළුව 2030 වසර වන විට, සියලුම ආකාරයේ මන්දපෝෂණය අවසන් කිරීම සහ නව යොවුන් වියේ ගැහැණු ළමයින්, ගර්භනී සහ කිරි දෙන කාන්තාවන් සහ වැඩිහිටි පුද්ගලයින් යන අයවළුන්ගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම.

2.2.1 දර්ශකය :
වයස අවුරුදු 5 ට අඩු ළමුන් අතර වර්ගය අනුව (මන්දනය සහ අධික බර) මන්දපෝෂණය (උස අනුව බර >+2 හෝ <-2 සම්මත අපගමනය - ලෝක සෞඛ්‍යය සංවිධානයේ ළමා වර්ධන ප්‍රමිතිවල මධ්‍යස්ථය අනුව) පැතිර පැවතීම.

2.3 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය :
ඉඩම්, අනෙකුත් නිෂ්පාදන සම්පත් සහ යෙදවුම්, දැනුම, මූල්‍ය සේවා, වෙළඳපළ සහ අගය එකතු කිරීම සහ ගොවිපල නොවන රැකියා සඳහා අවස්ථා යනාදී දෑ හරහා ඒවා වෙත සුරක්ෂිතව හා සමාන ප්‍රවේශයක් ලබා දීම ඇතුළුව 2030 වසර වන විට, කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ, විශේෂයෙන්ම කාන්තාවන්, ආදී වාසීන්, පවුල් ගොවීන්, එඬේරුන් සහ ධීවරයින් අයගේ කෘෂිකාර්මික ඵලදායිතාව සහ ආදායම දෙගුණ කිරීම.

2.3.1 දර්ශකය :
ස්ත්‍රී පුරුෂ භාවය සහ ස්වදේශික තත්ත්වය අනුව, කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ සාමාන්‍ය ආදායම.

ඉලක්ක 9 : කර්මාන්ත, නවෝත්පාදන සහ යටිතල පහසුකම් :
ඔරොත්තු දී පවතින යටිතල පහසුකම් ගොඩනැගීම, අන්තර්ගතභාවය සහ තිරසර කාර්මිකකරණය ප්‍රවර්ධනය කිරීම සහ නවෝත්පාදනයන් පෝෂණය කිරීම.

9.2 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය :
ඇතුළත්තිය හා තිරසාර කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම සහ 2030 වසර වන විට, ජාතික තත්වයන්ට අනුකූලව, කර්මාන්තයේ රැකියා කොටස සහ දළ දේශීය නිෂ්පාදිතය සැලකිය යුතු ලෙස ඉහළ නැංවීම සහ ඌණ සංවර්ධිත රටවල එහි කොටස දෙගුණ කිරීම.

9.2.1 දර්ශකය :

- දළ ජාතික නිෂ්පාදිතයේ සහ ඒක පුද්ගල ආදායමේ අනුපාතයක් ලෙස නිෂ්පාදන අගය එකතු කිරීම.
- සමස්ත සේවා නියුක්තියේ ප්‍රතිශතයක් ලෙස රැකියා නිෂ්පාදනය.

9.4 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය :
2030 වසර වන විට, සියලු රටවල් තම හැකියාවන්ට අනුකූලව ක්‍රියා කරමින් යටිතල පහසුකම් සහ ප්‍රතිනිර්මිත කර්මාන්ත වැඩිදියුණු කිරීම, සම්පත් පරිහරණ කාර්යක්ෂමතාව වැඩි කිරීම සහ පිරිසිදු හා පරිසර හිතකාමී තාක්ෂණයන් සහ කාර්මික ක්‍රියාවලින් වැඩි වශයෙන් භාවිතා කිරීම.

9.4.1 දර්ශකය :
අගය එකතු කරන ලද, ඒකකයකට කාබන් ඩයොක්සයිඩ් - CO_2 - විමෝචනය

9.5 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය :
2030 වසර වන විට නවෝත්පාදන දිරිමත් කිරීම සහ රාජ්‍ය හා පෞද්ගලික පර්යේෂණ සහ සංවර්ධන වියදම් සඳහා වන පර්යේෂණ හා සංවර්ධන සේවකයින් සංඛ්‍යාව සැලකිය යුතු ලෙස වැඩි කිරීම ඇතුළුව, 2030 වසර වන විට, විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල, විද්‍යාත්මක පර්යේෂණ වැඩි දියුණු කිරීම හා කාර්මික අංශවල තාක්ෂණික හැකියාවන් වැඩි දියුණු කිරීම.

9.5.1 දර්ශකය :

- දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස පර්යේෂණ සහ සංවර්ධන වියදම් වැඩි දියුණු කිරීම.
- ජනගහනය මිලියනයකට පර්යේෂකයන් (පූර්ණ කාලීනව සමාන)

ඉලක්ක 12 : වගකීම් සහිත පරිභෝජනය සහ නිෂ්පාදනය :
තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම.

12.5 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය :
2030 වසර වන විට, වැළැක්වීම, අඩු කිරීම, ප්‍රතිචක්‍රීකරණය සහ නැවත භාවිතය තුළින් අපද්‍රව්‍ය උත්පාදනය සැලකිය යුතු ලෙස අඩු කිරීම.

12.5.1 දර්ශකය :
ජාතික ප්‍රතිචක්‍රීකරණ අනුපාතය, ප්‍රතිචක්‍රීකරණය කරන ලද ද්‍රව්‍යය ටොන් ගණන.

12.7 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය :
ජාතික ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතාවලට අනුකූලව තිරසාර රාජ්‍ය ප්‍රසම්පාදන පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම.

12.7.1 දර්ශකය :
තිරසාර රාජ්‍ය ප්‍රසම්පාදන ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කරන රටවල් ගණනාව.

12 අ. අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය :
සංවර්ධනය වෙමින් පවතින රටවලට වඩා තිරසාර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් කරා ගමන් කිරීම සඳහා ඔවුන්ගේ විද්‍යාත්මක හා තාක්ෂණික ධාරිතාව ශක්තිමත් කිරීමට සහාය වීම.

12 අ. 1 දර්ශකය :
තිරසාර පරිභෝජනය හා නිෂ්පාදනය සහ පාරිසරික වශයෙන් යහපත් තාක්ෂණයන් සඳහා පර්යේෂණ සහ සංවර්ධනය උදෙසා සංවර්ධනය වෙමින් පවතින රටවලට ලැබෙන ආධාර ප්‍රමාණය.

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
මූල්‍ය ප්‍රකාශවලට සටහන්
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	31/12/2023 රු.	31/12/2022 රු.
02. ආදායම		
ත්‍රිපෝෂ විකුණුම්	2,468,681,435	740,056,360
සුපෝෂ විකුණුම්	1,146,606,048	680,256,519
ප්‍රදාන ගැළපුම් (2.1 වන සටහන)	1,708,779,935	-
කැලරි බාර් විකුණුම්	4,360,160	-
හයිලන්ඩ් නිෂ්පාදන විකුණුම්	6,650,650	3,189,625
ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩල නිෂ්පාදන විකුණුම්	963,910	520,120
ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩල විකුණුම්	1,038,185	-
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා නිෂ්පාදන විකුණුම්	394,640	-
බේකරි නිෂ්පාදන	2,622,500	481,290
ප්‍රතිපරිභෝජ්‍ය කිරිපිටි විකුණුම්	-	35,872,750
	5,340,097,463	**1,460,376,665**
2.1 ප්‍රදානිත අමු ද්‍රව්‍ය පරිභෝජනයේ ගැළපුම		
ලෝක ආහාර වැඩසටහන මගින් දෙන ලද අමු ද්‍රව්‍ය ආධාරය (බඩ ඉරිඟු)	1,125,606,386	
ලෝක ආහාර වැඩසටහන මගින් දෙන ලද අමු ද්‍රව්‍ය ආධාරය (සෝයා)	426,048,550	
එස් ඒ ජී ටී සමාගම විසින් ප්‍රදානය කරන ලද අමු ද්‍රව්‍ය (කිරිපිටි සඳහා)	157,125,000	
	1,708,779,935	
03. පරිභෝජනයට සූදානම් නිෂ්පාදනවල පිරිවැය		
2023.01.01 දිනට නිමි නිෂ්පාදන (3.1 වන සටහන)	40,812,800	46,570,967
නිමි නිෂ්පාදන සඳහා දුබලතා ගැළපුම් (3.2 වන සටහන)	(11,495,995)	9,276,326
2023.01.01 දිනට ගළපන ලද ශේෂය	**29,316,805**	**55,847,293**
මුළු නිෂ්පාදන පිරිවැය	4,488,344,771	1,448,592,669
2023.12.31 දිනට නිමි නිෂ්පාදන	(83,166,770)	(106,552,464)
	4,434,494,806	**1,397,887,498**
3.1 2023.01.01 දිනට ගළපන ලද නිමි නිෂ්පාදන		
නිමි නිෂ්පාදන සටහන් කළ අගය (ලාභාලාභ) - 2022.12.31	106,552,464	-
2022 දී ගළපන ලද දුබලතාව	(65,739,664)	-
නිමි නිෂ්පාදනවල තථ්‍ය අගය (ශේ /ප) - 2022.12.31	**40,812,800**	**-**
3.2 නිමි භාණ්ඩ සඳහා දුබලතා ගැළපුම්		
දුබලතාව හේතුවෙන් අගය අඩු වීම - 2023	11,495,995	-
	11,495,995	**-**
04. විකුණුම් පිරිවැය		
2023.01.01 දිනට ශේෂය (4.1 වන සටහන)	21,317,523	18,282,782
වට්ටෝරු භාණ්ඩ දුබලතාවට පත්වීම (4.2 වන සටහන)	(4,639,427)	-
2023.01.01 දිනට ගළපන ලද ශේෂය	16,678,096	-
කිරිපිටි විකුණුම් පිරිවැය	-	20,493,000
කැලරි බාර් වියදම්	2,988,291	-
ගැනුම් - හයිලන්ඩ් නිෂ්පාදන	5,359,046	2,792,580
ගැනුම් - ජා.ආ. ප්‍ර. ම. නිෂ්පාදන	863,548	733,922
ගැනුම් - ජා.ප ස. ම. නිෂ්පාදන	851,881	-
ගැනුම් - ශ්‍රී ලංකා රා. වැ. සංස්ථා නිෂ්පාදන	355,450	-
ගැනුම් - බේකරි හා වෙනත්	1,985,081	815,030
	29,081,393	43,117,314
2023.12.31 දිනට ශේෂය	(1,334,298)	(26,810,929)
	27,747,095	**16,306,385**

	31/12/2023 රු.	31/12/2022 රු.
4.1 2023.01.01 දිනට ගළපන ලද නිමි නිෂ්පාදන		
නිමි නිෂ්පාදන සටහන් කළ අගය (ලාභාලාභ) - 2022.12.31	26,810,929	-
2022 දී ගළපන ලද දුබලතාව	(5,493,406)	-
නිමි නිෂ්පාදනවල තථ්‍ය අගය (ශේ /ප) - 2022.12.31	**21,317,523**	
4.2 නිමි භාණ්ඩ සඳහා දුබලතා ගැළපුම්		
දුබලතාව හේතුවෙන් අගය අඩු වීම - 2023	4,639,427	-
	4,639,427	**-**
05 වෙනත් ආදායම්		
අපතය විකුණුම්	60,011,796	9,697,533
අසාමාන්‍ය අපතය පිටි විකුණුම්	-	6,117,450
වෛද්‍යාධාර වියදම් ප්‍රතිපූරණය (ශ්‍රී.ලං.ර.ස. වෙතින්)	-	1,662,531
කිරිපිටි ප්‍රදාන (ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙතින්)	-	897,000
කුලී ආදායම	419,700	524,775
ණය මත පොලී ආදායම	3,699,241	1,574,156
භාණ්ඩාගාර බිල්පත් මත පොලිය (රෙපෝ)	15,171,034	12,714,887
ස්ථාවර තැන්පතු මත පොලී	50,578,475	25,178,279
අරමුදල් කළමනාකරණ ගිණුම මත පොලී	7,883,134	-
ලේඛන ගාස්තු සහ වෙනත්	8,879,699	1,417,507
	146,643,079	**59,784,117**
06 විකුණුම් හා බෙදාහැරීමේ වියදම්		
ප්‍රවාහන වියදම්	571,147	89,788
බෙදාහැරීම	10,784,191	1,196,955
වාහන අලුත්වැඩියා හා නඩත්තු ගාස්තු	6,038,159	3,763,071
අලෙවි සැල් වියදම්	311,863	318,009
මුද්‍රණ හා ප්‍රචාරණ	21,354,154	3,555,389
නිල ඇඳුම් - අලෙවි	240,165	-
පර්යේෂණ සහ සංවර්ධන	336,739	-
විකුණුම් කොමිස් සහ වෙනත් වියදම්	92,524	3,040
ක්ෂය වීම	4,074,400	4,074,400
	43,803,343	**13,000,652**
07. පරිපාලන වියදම්		
වැටුප්	11,294,090	11,836,521
සේවක අර්ථසාධක අරමුදල	2,136,079	2,202,166
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල	427,416	440,463
අතිකාල දීමනා	6,768,223	3,823,046
දීමනා	7,013,091	5,359,356
අනියම් වේතන	-	138,000
අනියම් වේතන මත සේ.අ.අ.	-	30,000
අනියම් වේතන මත සේ.නි.භා.අ.	-	4,500
සේවාස්ථ ගෙවීම්	-	104,694
කළමනාකරණ දීමනා	5,066,676	7,484,809
කාර්යමණ්ඩල සුබසාධනය	1,268,705	2,844,762
වරිපනම් සහ බදු	641,445	14,829,295
කාර්යාල උපකරණ නඩත්තු	3,290,524	2,363,579
ආරක්ෂක ගාස්තු	9,209,992	7,725,326
මෝටර් වාහන ඉන්ධන	2,054,532	1,339,349

මෝටර් වාහන අලුත්වැඩියා හා නඩත්තු	4,846,860	3,254,132
වෙනත් සේවා හා නඩත්තු	97,860	339,607
රසායනාගාර වියදම්	2,472,233	1,525,831
තේ හා වෙනත්	117,857	226,479
රක්ෂණ	5,853,008	4,818,945
සිද්ධි කළමනාකරණ සේවා	656,301	592,983
ලිපි ද්‍රව්‍ය	712,918	1,027,086
තැපැල් ගාස්තු	357,500	85,000
දුරකථන ගාස්තු	538,252	484,353
කාර්යමණ්ඩල පුහුණු කිරීමේ ගාස්තු	1,670,274	191,560
නෛතික හා වෘත්තිය ගාස්තු	2,637,878	2,632,945
බලපත්‍ර හා රක්ෂණ ගාස්තු	1,718,997	1,369,810
වෛද්‍ය හා සනීපාරක්ෂක	522,931	544,162
ගමන් වියදම්	105,800	82,050
ඉලක්ක දිරි දීමනා	12,687,147	12,677,481
නිල ඇඳුම් - පරිපාලන	620,500	-
ක්ෂය වීම	4,523,090	4,816,997
	89,310,178	**95,195,285**

08. මූල්‍ය හා වෙනත් වියදම්

බැංකු ගාස්තු	42,300	22,810
සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද	76,433,720	-
පෙර වර්ෂ ආදායම් බදු ගෙවීම	3,435,376	-
වෙනත් වියදම්	8,639	2,050
හායනය හේතුවෙන් වටිනාකම අඩු කිරීම	25,801	71,233,070
බැංකු ණය මත පොලිය (ලංකා බැංකුව)	-	445,955
ප්‍රදාන	348,588	112,500
	80,294,424	**71,816,385**

09. ආදායම් බදු වියදම්

ජංගම ආදායම් බදු වියදම්	235,181,129	-
එකතු කළා - විලම්බිත බදු වත්කම්	20,503,051	(25,735,350)
	255,684,180	**(25,735,350)**

10. මිලදී ගැනුම්

බඩ ඉරිගු	490,621,431	532,751,000
සෝයා	643,410,012	354,388,441
කිරි පිටි	626,405,807	154,392,516
ඛනිජ ලවණ	140,330,300	10,194,725
විටමින් වර්ග	52,472,450	8,508,800
සහල්	555,540	592,500
පොලිතින් රීල්	113,906,848	39,035,937
ක්‍රාෆ්ට් කඩදාසි බෑග්	60,510,755	20,557,013
ට්වයින් නූල්	446,015	-
සුපෝෂ පොලිතින් රීල්	58,993,034	45,442,867
සුපෝෂ රැළි පෙට්ටි	21,722,213	19,788,052
	2,209,374,406	**1,185,651,849**

11 අමු ද්‍රව්‍ය ප්‍රදාන

බඩ ඉරිගු	1,290,523,430	68,042,160
සෝයා	711,017,914	34,498,109
කිරි පිටි	157,125,000	897,000
	2,158,666,344	**103,437,269**

බඩ ඉරිඟු සහ සෝයා - සෞඛ්‍ය අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහන සහ සී/ස ත්‍රිපෝෂ සමාගම යන ආයතනවල නිලධාරීන් විසින් අත්සන් කරන ලද බහු පාර්ශවීය ගිවිසුමට අනුව, ජාතික ත්‍රිපෝෂ වැඩසටහන වෙනුවෙන් ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා අවශ්‍ය ගුණාත්මක අමු ද්‍රව්‍ය හිඟ වීම හේතුවෙන් මූල්‍ය ආධාර ලබා දීමට එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහන එකඟ වී ඇත. සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටියට අනුව, ජාතික පෝෂණ වැඩසටහනට ආධාර පිණිස බඩ ඉරිඟු සහ සෝයා තොග ප්‍රදාන කීපයක් සැපයීමට ලෝක ආහාර වැඩසටහන එකඟ වී ඇත. ඒ පිළිබඳ විස්තරාත්මක තොරතුරු පහත දක්වා තිබේ.

කිරිපිටි - සෞඛ්‍ය අමාත්‍යාංශය, සවුත් ඒසියා ගේට්වේ ටර්මිනල්ස් පුද්ගලික සමාගම ී(ධ්ම) සහ ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම යන ආයතනවල නිලධාරීන් විසින් අත්සන් කරන ලද බහුපාර්ශවික ගිවිසුමට අනුව, එක් කිලෝග්‍රෑමයකට රු. 2,095/- ක් වන සේ කිරිපිටි මෙ. ටොන් 75 ක් වූ ප්‍රමාණයක් ලබා දීමට සවුත් ඒසියා ගේට්වේ ටර්මිනල්ස් පුද්ගලික සමාගම එකඟ වී ඇත.

2023.12.31 දින වන විට පරිභෝජනය නොකළ බඩ ඉරිඟු සහ සෝයා පිළිවෙලින් කිලෝග්‍රෑම් 1,255,475 ක් සහ කිලෝග්‍රෑම් 1,362,115 ක ශේෂ තොගයක් ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම සතුව ඇත. එබැවින්, මෙය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ විලම්බිත ආදායමක් ලෙස සලකන ලදි.

	කි.ග්‍රෑ. 1 කට මිල	ප්‍රදානය කළ / ලද ප්‍රමාණය (කි.ග්‍රෑ.)	ප්‍රදානයේ වටිනාකම (රු.)
බඩ ඉරිඟු	255.00	1,095,206	279,277,530
සෝයා බෝංචි	397.00	299,833	119,033,701
සෝයා බෝංචි	445.00	300,000	133,500,000
කිරි පිටි	2,095.00	75,000	157,125,000
බඩ ඉරිඟු	194.00	1,964,550	381,122,700
සෝයා බෝංචි (මෙ.ටො. 506)	243.98	509,464	124,299,027
බඩ ඉරිඟු	182.50	2,000,000	365,000,000
බඩ ඉරිඟු	192.00	1,380,850	265,123,200
සෝයා බෝංචි (ස.අ. බදු / ගබඩා පිරිවැය හැර) (මෙ.ටො.1305)	230.55	1,307,496	301,449,186
සෝයා බෝංචි	330.00	99,200	32,736,000
			2,158,666,344

	31/12/2023 රු.	31/12/2022 රු.
12 සෘජු ශ්‍රමය සහ කළමනාකරණ පිරිවැය		
වැටුප්	76,938,425	79,550,397
සේවක අර්ථසාධක අරමුදල	14,303,040	14,843,146
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල	2,857,864	2,968,629
අතිකාල දීමනා	60,188,469	25,234,482
දිමනා	31,902,459	33,015,390
පාරිතෝෂික	4,647,286	3,716,378
සේවාස්ථ ගෙවීම්	491,591	88,072
නිල ඇඳුම් සහ ලොන්ඩරි සේදුම්	10,823,970	5,703,003
තේ හා වෙනත්	10,628,418	6,027,281
සේවා මුර හා ආහාරපාන දිමනාව	3,483,890	1,152,463
වෛද්‍ය හා සනීපාරක්ෂක	1,984,930	1,044,664
අනියම් හා කොන්ත්‍රාත් වැටුප්	2,685,842	2,507,212
අනියම් හා කොන්ත්‍රාත් වැටුප් මත සේ.අ.අ.	545,451	474,553
අනියම් හා කොන්ත්‍රාත් වැටුප් මත සේ.නි.භා.අ.	106,515	100,714
සුබසාධන වියදම්	1,402,012	70,738
දිරි දීමනා	15,390,731	15,676,787
	238,380,892	**192,173,910**

	31/12/2023 රු.	31/12/2022 රු.
13 කම්හල් පොදුකාර්ය පිරිවැය		
විදුලි ජනකය සහ බොයිලේරුව සඳහා ඉන්ධන	113,642,807	30,911,643
පිරියත හා යන්ත්‍රෝපකරණ නඩත්තු	40,997,630	3,557,847
විද්‍යාගාර වියදම්	22,136,811	5,317,504
විදුලිය	78,394,472	21,839,712
ගොඩනැගිලි අලුත්වැඩියා හා නඩත්තු	6,040,372	848,622
වෙනත් සේවා හා නඩත්තු	15,311,715	4,483,741
උද්‍යාන නඩත්තුව	249,266	108,020
කුලී වියදම්	6,754,289	-
ක්ෂය වීම	80,451,242	55,255,191
	363,978,602	**122,322,279**

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
මූල්‍ය ප්‍රකාශවලට සටහන්
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

14. දේපළ, පිරියත හා උපකරණ

පිරිවැය / ප්‍රත්‍යාගණනය	2022.12.31 දිනට ශේෂය	ගැළපුම් : 2023	එකතු කිරීම් : 2023	2023.12.31 දිනට ශේෂය
ඉඩම්	430,000,000	-	-	430,000,000
ගොඩනැගිලි	174,309,676	424,817	-	174,734,493
පිරියත හා උපකරණ	597,111,725	-	36,312,862	633,424,587
මෝටර් රථවාහන	37,372,000	-	-	37,372,000
ආම්පන්න හා උපකරණ	12,660,886	-	1,276,459	13,937,345
විද්‍යාගාර උපකරණ	10,189,130	-	38,553,947	48,743,077
විදුලි වැඩ	4,660,000	-	-	4,660,000
කාර්යාල උපකරණ	9,131,746	-	1,220,295	10,352,041
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	12,293,020	-	9,176,822	21,469,842
අස්පෘශ්‍ය වත්කම්	-	-	612,925	612,925
පරිගණක හා වෙනත් දෘඩාංග	9,134,011	-	488,450	9,622,461
	1,296,862,195	**424,817**	**87,641,760**	**1,384,928,772**

සමුච්චිත ක්ෂය කිරීම්	2022.12.31 දිනට ශේෂය	ගැළපුම් : 2023	වර්ෂය සඳහා අය : 2023	2023.12.31 දිනට ශේෂය
ගොඩනැගිලි	23,332,500		8,736,725	32,069,225
පිරියත හා උපකරණ	122,043,977		60,896,302	182,940,278
මෝටර් රථවාහන	22,611,067		7,474,400	30,085,467
ආම්පන්න හා උපකරණ	4,843,192		2,680,018	7,523,210
විද්‍යාගාර උපකරණ	2,861,362		3,806,197	6,667,559
විදුලි වැඩ	2,796,000		932,000	3,728,000
කාර්යාල උපකරණ	2,782,274		962,204	3,744,478
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	3,024,997		1,539,369	4,564,366
අස්පෘශ්‍ය වත්කම්	-		25,539	25,539
පරිගණක හා වෙනත් දෘඩාංග	6,768,186		1,995,978	8,764,164
	191,063,555	**-**	**89,048,731**	**280,112,286**

ලියා අඩු කළ අගය	2022.12.31 දිනට ශේෂය රු.	2023.12.31 දිනට ශේෂය රු.
ඉඩම්	430,000,000	430,000,000
ගොඩනැගිලි	150,977,176	142,665,268
පිරියත හා උපකරණ	475,067,748	450,484,309
මෝටර් රථවාහන	14,760,933	7,286,533
ආම්පන්න හා උපකරණ	7,817,695	6,414,135
විද්‍යාගාර උපකරණ	7,327,768	42,075,518
විදුලි වැඩ	1,864,000	932,000
කාර්යාල උපකරණ	6,349,472	6,607,563
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	9,268,023	16,905,476
අස්පෘශ්‍ය වත්කම්	-	587,386
පරිගණක හා වෙනත් දෘඩාංග	2,365,825	858,297
	1,105,798,640	**1,104,816,486**

		31/12/2023	31/12/2022
		රු.	රු.
15 ලැබිය යුතු සේවක ණය			
නිවාස ණය - සුබසාධක		29,587,581	-
නිවාස ණය - ආපදා		20,155,739	-
		49,743,321	-
16 වට්ටෝරු භාණ්ඩ			
අමු ද්‍රව්‍ය			
බඩ ඉරිඟු		337,781,847	118,245,268
සෝයා		351,282,773	46,391,386
කිරි පිටි		47,432,400	5,862,129
ඛනිජ ලවණ		7,196,875	10,354,700
විටමින් වර්ග		7,485,000	13,481,872
		751,178,894	**194,335,355**
ත්‍රිපෝෂ ඇසුරුම් ද්‍රව්‍ය			
පොලිතින් රීල්		5,699,280	40,524,365
ක්‍රාෆ්ට් කඩදාසි බෑග්		7,909,650	11,426,400
ට්වයින් නූල්		543,119	275,057
		14,152,049	**52,225,822**
සුපෝෂ ඇසුරුම් ද්‍රව්‍ය			
පොලිතින් රීල්		17,544,037	26,680,520
රැළි පෙට්ටි		4,075,550	10,244,218
ග්‍රේ බැක් බොක්ස් බෝඩ්		1,380,975	1,406,776
ගම් ටේප්		448,465	889,888
		23,449,027	**39,221,401**
වෙනත්			
ඉංජිනේරු ගබඩා		59,774,535	62,804,094
ඩීසල්		4,056,570	11,811,240
		63,831,105	**74,615,334**
කෙරෙමින් පවත්නා වැඩ			
අමු ද්‍රව්‍ය			
බඩ ඉරිඟු		9,600,000	13,260,000
සෝයා		4,003,962	11,932,630
කිරි පිටි		-	3,153,677
ඛනිජ ලවණ		122,500	815,580
විටමින් වර්ග		547,453	470,421
ත්‍රිපෝෂ ඇසුරුම් ද්‍රව්‍ය			
පොලිතින් රීල්		229,330	2,741,370
ක්‍රාෆ්ට් කඩදාසි බෑග්		272,025	1,738,800
ට්වයින් නූල්		4,719	8,315
සුපෝෂ ඇසුරුම් ද්‍රව්‍ය			
පොලිතින් රීල්		313,171	1,614,340
රැළි පෙට්ටි		68,730	394,478
		15,161,890	**36,129,610**
නිමි භාණ්ඩ : ත්‍රිපෝෂ		68,227,232	2,354,210
නිමි භාණ්ඩ : ත්‍රිපෝෂ (භායනය ගළපා ඇත)	16.1	-	38,458,591
		68,227,232	**40,812,800**

නිමි භාණ්ඩ : සුපෝෂ (හායනය ගළපා ඇත)	16.2	-	8,127,086
අලෙවි අංශය			
නිමි භාණ්ඩ : සුපෝෂ		14,939,539	11,982,394
නිමි භාණ්ඩ : කැලරි බාර්		74,747	-
කෙරෙමින් පවත්නා වැඩ		756,923	-
අලෙවිසැල් තොග		502,628	1,208,043
		16,273,836	**13,190,437**
එකතුව		**952,274,033**	**458,657,846**

	31/12/2023 රු.	31/12/2022 රු.
16.1 නිමි භාණ්ඩ : ත්‍රිපෝෂ (හායනය ගළපා ඇත)		
නිමි භාණ්ඩ පිරිවැය	-	104,198,254
හායනය හේතුවෙන් අගය අඩු කිරීම	-	(65,739,664)
	-	**38,458,591**
16.2 නිමි භාණ්ඩ : සුපෝෂ (හායනය ගළපා ඇත)		
නිමි භාණ්ඩ පිරිවැය	-	13,620,492
හායනය හේතුවෙන් අගය අඩු කිරීම	-	(5,493,406)
	-	**8,127,086**
17 වෙළඳ හා වෙනත් ලැබීම්		
ණයකරුවන්	204,065,974	37,890,778
ණයකරුවන් : අලෙවි	48,493,608	53,602,756
අත්තිකාරම් සහ පූර්ව ගෙවීම්	5,461,074	3,669,157
ලැබිය යුතු ආදායම් බදු	800,000	600,000
ලැබිය යුතු රක්ෂණ	864,637	573,116
තැන්පතු	2,126,000	2,126,000
නිවාස ණය - වත්කම්	13,914,566	47,861,966
නිවාස ණය - ආපදා	9,252,332	33,419,201
තාවකාලික සහන ණය	36,720	157,313
විශේෂ සහන ණය - නව	35,658	-
කොවිඩ් - 19 විශේෂ ණය	-	3,214
විශේෂ ආපදා ණය - ත්‍රිපෝෂ සමාගමේ සුබසාධන	2,694,019	2,474,393
උත්සව අත්තිකාරම්	39,500	165,711
විනෝද චාරිකා අත්තිකාරම්	2,200	2,200
අයවිය යුතු වැට් බදු	53,782,252	-
ලැබිය යුතු පොලී ආදායම්	5,649,373	-
	347,217,913	**182,545,806**

අයවිය යුතු ආදායම් බදු

පාඩු ලද වසරක් වූ 2022 වර්ෂය තුළ කළ පූර්ව අත්තිකාරම් ආදායම් බදු ගෙවීම්, මෙම ශේෂය නියෝජනය කළේ ය. ඉහත ගෙවීම යථා කාලයේ දී සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම වෙත බැර කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් විගණනයක් සිදු කරනු ලබමින් පවතී.

අයවිය යුතු වැට් බදු

නව වැට් බදු මාර්ගෝපදේශයන්ට අනුව, ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම විසින් නිෂ්පාදනය කරනු ලබන සියලු නිමි භාණ්ඩ 2024/01/01 සිට ක්‍රියාත්මක වන පරිදි වැට් බද්දට යටත් වේ. 2023 වසරේ 4 වන කාර්තුවට අදාළ බදු ඉන්වොයිසි සඳහා ත්‍රිපෝෂ සමාගමට වැට් බදු ආදාන ඉල්ලා සිටිය හැකි බැවින්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග සාකච්ඡා කිරීමෙන් පසු ඉහත සඳහන් ගැළපුම සිදු කර ඇත.

18 මුදල් හා මුදල් සමාන දෑ

ලංකා බැංකුව, ජා-ඇල : 71324617 / 91400366	258,291,873	76,633,346
ලංකා බැංකුව, ජා-ඇල : 80306903 / 91400437	281,410,988	52,111,523
සුළු මුදල්	20,000	-
භාණ්ඩාගාර බිල්පත් මත ආයෝජන 18.1	92,500,000	93,776,635
ස්ථාවර තැන්පතු මත ආයෝජන 18.2	236,130,348	291,252,335
	868,353,209	**513,773,838**

අරමුදල් කළමනාකරණ ගිණුම් (91400366 සහ 91400437)

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු ජංගම ගිණුම්වල ආයෝජනය කර ඇති අතිරික්ත අරමුදල් සලකා බලා 2023 අගෝස්තු මාසයේ දී අරමුදල් කළමනාකරණ ගිණුම් විවෘත කරන ලදී.

18.1 භාණ්ඩාගාර බිල්පත්හි ආයෝජන : ප්‍රතිගැනුම් ගිවිසුම

මධ්‍යම තැන්පතු පද්ධති ගිණුම	2023.12.31 දිනට වාහක මුදල	2022.12.31 දිනට වාහක මුදල
RET-Y107471000 - 01	71,500,000	71,596,250
RET-Y107471000 - 02	21,000,000	22,180,385
	92,500,000	**93,776,635**

18.2 ස්ථාවර තැන්පතු මත ආයෝජන

ගිණුම් අංකය	2023.12.31 දිනට වාහක මුදල	2022.12.31 දිනට වාහක මුදල
89182568	-	208,464,038
90205288	28,387,387	-
90205292	28,387,387	-
90205295	28,387,387	-
90205303	28,387,387	-
90205412	28,387,387	-
83258807	8,546,313	7,494,928
82420963	6,728,032	5,884,468
81508819	25,762,497	22,496,945
81048092	6,993,549	6,143,391
80940675	17,689,864	15,560,588
80871912	19,321,454	17,216,307
80586829	9,151,703	7,991,669
	236,130,348	**291,252,335**

* ඉහත තැන්පතු ලංකා බැංකුවෙහි ආයෝජනය කරනු ලැබ ඇත.

19 ප්‍රකාශිත ප්‍රාග්ධනය

කොටස් ප්‍රාග්ධනය	304,600,000	304,600,000
	304,600,000	**304,600,000**

අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයක ප්‍රතිඵලයක් ලෙස, ත්‍රිපෝෂ සමාගමේ කළමනාකාරිත්වය, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද සම්පූර්ණ රජය සතු පොදු සීමිත සමාගමක් වෙත පවරනු ලැබ ඇත. ඒ අනුව, රු. 304,600,000/= ක (රුපියල් තුන්සිය හතර මිලියන හයසිය දහසක) ප්‍රකාශිත ප්‍රාග්ධනය සහිතව 2010 සැප්තැම්බර් මස 17 වන දින ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් නමැති සමාගම සංස්ථාපනය කරන ලදී.

20 ප්‍රාග්ධන සංචිත

වසර ආරම්භයේ ශේෂය	407,750,516	407,750,516
වසර අවසානයේ ශේෂය	**407,750,516**	**407,750,516**

21 ප්‍රත්‍යාගණන සංචිත

වසර ආරම්භයේ ශේෂය	518,157,038	511,096,168
ප්‍රත්‍යාගණන ගැළපුම		7,060,870
වර්ෂය අවසානයේ ශේෂය	**518,157,038**	**518,157,038**

22 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

වසර ආරම්භයේ ශේෂය	79,162,809	78,690,831
අඩු කළා : වර්ෂය තුළ ගෙවීම්	(5,561,625)	(3,244,400)
වර්ෂය සඳහා ප්‍රතිපාදන - 2023	4,647,286	3,716,378
වර්ෂය අවසානයේ ශේෂය	**78,248,470**	**79,162,809**
පාරිතෝෂිකයේ වර්තමාන කොටස	(5,306,061)	-
	72,942,409	**79,162,809**

වට්ටම් ගත අනුපාතය	8%	8%
ඉදිරි වැටුප් වර්ධක අනුපාතය	10%	10%
කාර්ය මණ්ඩල පිරිවැටුම්	2%	2%
විශ්‍රාම ගැනීමේ වයස	අවු. 60	අවු. 60

	31/12/2023 රු.	31/12/2022 රු.
23 වෛද්‍යාධාර අරමුදල		
වසර ආරම්භයේ ශේෂය	435,786	433,945
වර්ෂය තුළ දායකවීම්	208,740	221,340
වර්ෂය තුළ ගෙවීම්	(330,300)	(219,499)
වර්ෂය අවසානයේ ශේෂය	**314,226**	**435,786**
24 විලම්බිත අදායම		
අයහාර ප්‍රදානය - ලෝක ආහාර වැඩසටහන	552,426,677	102,540,269
	552,426,677	**102,540,269**
25 වෙළෙඳ හා වෙනත් ගෙවීම් නියමිත		
ණය හිමියන්	116,596,939	209,866,983
වැටුප් පාලන ගිණුම	465,348	2,559,599
පාරිතෝෂිකයේ වර්තමාන කොටස	5,306,061	-
ගෙවිය යුතු වැට් බදු	180,620	-
ගෙවිය යුතු ලාභාංශ	-	10,000,000
ගෙවිය යුතු ආදායම් බදු	231,818,213	-
ගෙවිය යුතු සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද	6,586,059	2,753,338
ගෙවිය යුතු තැන්පතු	56,599,988	52,848,238
	417,553,229	**278,028,157**
26 පූර්ව ගැලපුම්		
ගෙවිය යුතු තැන්පතු	25,000	-
ස්ථාවර තැන්පතු	17,313,010	-
ඉංජිනේරු තොග	-	3,398,232
ප්‍රාග්ධන වියදම	(424,817)	253,832
පුනරාවර්තන වියදම	(698,360)	4,491,219
ත්‍රිපෝෂ නිම් භාණ්ඩ අඩුවෙන් තක්සේරු කිරීම	11,495,995	9,276,326
හායනය හේතුවෙන් අගය අඩු කිරීම- සුපෝෂ	4,639,427	-
ක්ෂය ගැළපුම	-	259,022
මුද්දර ගාස්තු	-	100
	32,350,255	**17,678,732**

27 ප්‍රාග්ධන ප්‍රදාන හා සම්බන්ධ ක්ෂය කිරීම්

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රදානය කර ඇති ස්ථාවර වත්කම්වලට අදාළ ක්ෂය කිරීම්, එම වර්ෂයේ මුළු ක්ෂය අය කිරීම් අඩු කරමින් අදාළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට අයගත කරගනු ලැබ එය, වර්ෂය සඳහා වන මුළු ක්ෂය අය කිරීම එල්ලේ හිලවු කර ඇත. 2023 වර්ෂය තුළ ප්‍රාග්ධන ප්‍රදානයට අදාළ ගැළපුමක් සිදු කර නොමැත.

28 බැඳියා සහ අවිනිශ්චිතතා

වාර්තා කරනු ලබන දිනයේදී කිසිදු සැලකිය යුතු බැඳියාවක් හෝ අවිනිශ්චිතතාවක් නොපැවතුණි.

29 සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම්

ප්‍රධාන පෙළේ කාර්යමණ්ඩල සාමාජිකයින් හා පවත්නා ගනුදෙනු

සමාගමෙහි ප්‍රධාන පෙළේ කාර්යමණ්ඩල සාමාජිකයින් වනුයේ, එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෝ හා නිරීක්ෂකයෝ ය. 2023 වර්ෂය තුළ, රැස්වීම්වලට සහභාගි වීමේ දීමනා සහ ප්‍රවාහන දීමනා ලෙස අධ්‍යක්ෂ මණ්ඩල සහ විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින් සඳහා පිළිවෙලින් රු. 622,500 සහ රු. 103,500 ක මුදලක් ගෙවා ඇත.

30 මූල්‍ය අවදානම් කළමනාකරණය

සමාගමේ කටයුතු, පහත දක්වා ඇති අවදානම් වැනි විවිධ මූල්‍ය අවදානම් වලට නිරාවරණය වේ:

(අ) වෙළෙඳ පොළ අවදානම (වෙළෙඳ පොළ අවදානම හා විදේශ විනිමය අවදානම ඇතුළුව)

(I) විදේශ විනිමය අවදානම

සමාගම විනිමය අනුපාතවල උච්චාවචනයන්ට සංවේදී වන අතර ප්‍රධාන වශයෙන් එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි අගය උච්චාවචනයන්ට නිරාවරණය වේ. සමාගමේ ක්‍රියාකාරී මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල වන අතර එමගින් බොහෝ ගනුදෙනු සිදු වේ. අනෙකුත් සියලුම ව්‍යවහාර මුදල් වාර්තා කිරීමේ කාර්යයන් සඳහා විදේශ මුදල් ලෙස සැලකේ.

(II) පොලී අනුපාත අවදානම

පොලී අනුපාත අවදානම යනු, වෙළෙඳ පොළ පොලී අනුපාතවල වෙනස්වීම් හේතුවෙන් මූල්‍ය මෙවලමක සාධාරණ අගය හෝ අනාගත මුදල් ප්‍රවාහ උච්ඡාවචනය වීමේ ඇති අවදානමයි. සමාගම තම පොලී අනුපාත අවදානම කළමනාකරණය කරන්නේ, මුදල් ප්‍රවාහ නිරීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීමෙන් සහ ණය ගැනීම් සඳහා හිතකර අනුපාත සාකච්ඡා කිරීම මගිනි.

(ආ) ණය අවදානම

සමාගම ව්‍යාපාර කටයුතු කරන අතරතුර ගනුදෙනුකරුවන්ට ණය පහසුකම් ලබා දෙයි. එබැවින්, වෙළඳ ණය නොගෙවීම, වෙළෙඳාමෙන් ලැබිය යුතු මුදල් හා සම්බන්ධයෙන් වූ ප්‍රධාන අවදානමකි.

ණය අවදානම් නිරාවරණය

සාමාන්‍යයෙන් ණය අවදානමට යටත් වන මූල්‍ය වත්කම්වල උපරිම අවදානම් නිරාවරණය, ඒවායේ වාහක මුදලට සමාන වේ. පහත වගුව මගින් උපරිම අවදානම් ස්ථාන ගෙන හැර දක්වයි.

	31/12/2023	31/12/2022
	රු.	රු.
වෙළෙඳ හා වෙනත් ගෙවීම් නියමිත	347,217,913	182,545,806
මුදල් හා මුදල් සාම්‍යයන්	868,353,209	513,773,838
මුළු ණය අවදානම් නිරාවරණය	**1,215,571,122**	**696,319,644**

(ඇ) ද්‍රවශීලතා අවදානම

මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් ලබා දීමෙන් පියවා ගනු ලබන මූල්‍ය වගකීම් හා සම්බන්ධ බැඳීම් සපුරාලීමේ දී සමාගම විසින් මුහුණ දෙනු ලබන අවදානම මෙය වන්නේ ය.

සමාගමේ සමස්ත අවදානම් කළමනාකරණ වැඩසටහන, මූල්‍ය වෙළෙඳපළවල පුරෝකතනය කළ නොහැකි බව කෙරෙහි අවධානය යොමු කරන අතර එමගින් සමාගමේ මූල්‍ය ක්‍රියාකාරීත්වයට ඇති විය හැකි අහිතකර බලපෑම් අවම කර ගැනීමට උත්සාහ කරයි.

31 වෙනත් සම්බන්ධිත හෙළිදරව් කිරීම්

31.1 ත්‍රිපෝෂ සමාගම හා සම්බන්ධ වට්ටෝරු භාණ්ඩවල තොග මට්ටම් වර්ග

මූලික උපකල්පන

තෝරාගත් අමු ද්‍රව්‍ය - බඩ ඉරිඟු

වරකට ප්‍රසම්පාදන සීමාව - රු. මි. 500 (ප්‍රසම්පාදන කමිටු බල අවසරය)

කි. ග්‍රෑ. එකක ඇස්තමේන්තුගත මිල - රු. 250/-

පවත්නා අමු ද්‍රව්‍ය ගබඩා ධාරිතාව (බඩඉරිඟු හා බඩ ඉරිඟු කි.ග්‍රෑ. 900000

සෝයා සඳහා මුළු එකතුව මෙ. ටොන් 1,250)

උපරිම පරිභෝජනය (කි.ග්‍රෑ.)	90,000	දිනකට
අවම පරිභෝජනය (කි.ග්‍රෑ.)	50,000	දිනකට
සාමාන්‍ය/ප්‍රමාණික භාවිතය (කි.ග්‍රෑ.)	70,000	දිනකට
ප්‍රති ඇණවුම් කාලය (දින)	30-60	
ප්‍රාමාණික ප්‍රති ඇණවුම් කාලය (දින)	30	
ප්‍රති ඇණවුම් ප්‍රමාණය (කි.ග්‍රෑ.)	2,000,000	
වාර්ෂික ප්‍රති ඇණවුම් වාර ගණන	9	
මුළු වාර්ෂික අවශ්‍යතාව (කි.ග්‍රෑ.)	18,000,000	

ප්‍රති ඇණවුම් මට්ටම = උපරිම පරිභෝජනය X උපරිම ප්‍රති ඇණවුම් කාලය

5,400,000 කි. ග්‍රෑ.

අවම තොග මට්ටම = ප්‍රති ඇණවුම් මට්ටම - (ප්‍රාමාණික පරිභෝජනය X ප්‍රාමාණික ප්‍රති ඇණවුම් කාලය)

3,300,000 කි. ග්‍රෑ.

උපරිම තොග මට්ටම = ප්‍රති ඇණවුම් මට්ටම + ප්‍රති ඇණවුම් ප්‍රමාණය - (අවම පරිභෝජනය x ප්‍රති ඇණවුම් කාලය)

5,900,000 කි. ග්‍රෑ.

සටහන : අමු ද්‍රව්‍ය ගබඩා ධාරිතාව දැනට නොමැති හෙයින්, ඉහත තොග මට්ටම් භාවිතය පවත්වා ගැනීමට සමාගමට නොහැකි විය.

31.2 2023.12.31 දිනට අපතය ද්‍රව්‍ය තොගයේ ශේෂය

2023.12.31 දිනට අපතය තොගයේ ශේෂය	ප්‍රමාණය	ඇස්තමේන්තුගත විකුණුම් මිල	ඇස්තමේන්තුගත මුදල
අපතය කුඩු (කි.ග්‍රෑ.)	966	93.20	90,031
සී එස් බී වියළි (කි.ග්‍රෑ.)	2,666	62.00	165,292
සෝයා සිවිය ඨ-1 (කි.ග්‍රෑ.)	1,972	58.00	114,376
බඩ ඉරිඟු ලෙලි (කි.ග්‍රෑ.)	935	28.00	26,180
පාවිච්චි කළ පොලි බෑග් (ගණන)	35,000	19.75	691,250
	එකතුව		**1,087,129**

මෙම තොග අඩු තක්සේරුගත ද්‍රව්‍ය ලෙස නිකුත් කළ හැකි බැවින්, ඉහත මුදල වසර අවසාන තොගයේ තක්සේරුව සඳහා ගනු නොලැබේ. එබැවින්, ඒවා විකුණන අවස්ථාවේ දී සමාගම එහි සැබෑ වටිනාකම හඳුනා ගනී.

31.3 2023 වසර තුළ ලාභාංශ ගෙවීම

	රු.
2021/2022/2023 මූල්‍ය වර්ෂ සඳහා ගෙවන ලද අතුරු ලාභාංශ	65,000,000
	65,000,000

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } MED/B/SLTL/01/2023/41 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2024 ජුලි 24 දින

සභාපති
සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම.

සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමාගමේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු

කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (1) (ඈ) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති හා විධිවිධානවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ viii වන පරිච්ඡේදයේ 10.1 වගන්තිය හා xii වන පරිච්ඡේදයේ 7.2 හා 7.3 වගන්ති	හදිසි රාජකාරි සම්බන්ධයෙන් සෙනසුරාදා, ඉරිදා හෝ රජයේ නිවාඩු දිනයක වැඩ කිරීමට නියම කරනු ලබන මාණ්ඩලික නිළධාරියෙකු එසේ වැඩ කළ එකිනෙක දිනය වෙනුවෙන් ඒකාබද්ධ මාසික වැටුපෙන් 1/20 ක සමාන මුදලක් ලබා ගැනීම සඳහා දිනකට පැය 08 කට නොඅඩු කාලයක් සේවය කළයුතු වුවත් මෙම දීමනාව ලබාගෙන තිබුණු සමාගමේ සියලුම නිළධාරීන් පැය 08ක සේවා කාලයක් සේවයේ යෙදී නොසිට රු. 1,615,088 ක නිවාඩු දින දීමනාවක් සමාලෝචිත වර්ෂය තුළදී ලබාගෙන තිබුණි. ඇඟිලි සලකුණු යන්ත්‍රයෙන් ලබාගත් දත්ත අනුව ඇතැම් නිළධාරීන් අදාළ නිවාඩු දින සේවයට වාර්තා කර නොතිබුණද, එම දිනයන් සඳහාද මෙම දීමනාව ලබාගෙන තිබුණි. තවද, එක් කාර්යයක් වෙනුවෙන් අදාළ කරගත යුත්තේ එක් දීමනාවක්/ වරප්‍රසාදයක් පමණක් වුවද මෙම දීමනාවට අමතරව වැඩ කරන

	මෙම එක් එක් නිවාඩු දිනයක් වෙනුවෙන් හිලව් නිවාඩු දිනයක් හෝ හිලව් නිවාඩු දින දීමනාවක් සමාගම ලබාදී තිබුණු අතර ඒ සඳහා රු.477,019 ක් ගෙවීම් කර තිබුණි.
(ආ) 2021 නොවැම්බර් 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ ආයතනික මාර්ගෝපදේශ සංග්‍රහය හා මෙහෙයුම් අත්පොත	
i. මාර්ගෝපදේශ සංග්‍රහය ii ඡේදය	අවම වශයෙන් මසකට වරක්වත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතු බවත්, භෞතිකව එම රැස්වීම පැවැත්විය නොහැකි විටක තාක්ෂණය භාවිතයෙන් හෝ පැවැත්විය යුතු බව දක්වා තිබුණ ද 2023 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 10ක් පමණක් පැවැත්වීමට කටයුතු කර තිබුණි.
ii. මාර්ගෝපදේශ සංග්‍රහය 4.2 (h) ඡේදය	විගණන කළමනාකරණ කමිටු රැස්වීම මාස තුනකට වරක් පැවැත්විය යුතු වුවද ත්‍රිපෝෂ සමාගම 2023 වර්ෂයට අදාළව පවත්වා තිබුණේ රැස්වීම් 3ක් පමණි.
iii. මෙහෙයුම් අත්පොතේ 3.2(v) ඡේදය	දිරිදීමනා ගෙවීමේදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගත යුතු වුවද එසේ අනුමැතිය රහිතව සුපෝෂ අලෙවියෙන් ඉලක්කගත දීමනාවක් ලෙස සමාගමේ සියළුම සේවකයින් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 12,687,147ක දිරිදීමනා මුදලක් ගෙවා තිබුණි.
iv. මෙහෙයුම් අත්පොතේ 3.3 ඡේදය	එක් එක් අංශයේ සේවක අවශ්‍යතාවය හා සංවිධාන සටහන ඇතුළත් උපායමාර්ගික මානව සම්පත් සැලැස්මක් සකස් කළ යුතු වුවත්, සමාගම ඒ අනුව කටයුතු කර නොතිබුණි.
v. මෙහෙයුම් අත්පොතේ 3.6 ඡේදය	සමාගම විසින් උපාය මාර්ගික සැලැස්ම, ක්‍රියාකාරී සැලසුම් මත පදනම්ව ඵලදායී කාර්යසාධන ඇගයුම් පද්ධතියක් හඳුන්වා දිය යුතු අතර, එක් එක් සේවකයාගේ ඵලදායිතාවය ආසන්න නිළධාරියා විසින් ඇගයීමට ලක්කළ යුතු වුවද, තෘතික මට්ටම සහ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිළධාරීන් සඳහා ඵලදායී කාර්යසාධන ඇගයුමක් සිදුකර නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂාවකදී අනාවරණය විය.
(ඇ) 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	මෙම චක්‍රලේඛය සමාගමේ සේවකයින් සඳහා අදාළ කර ගත නොහැකි වුවද සමාගමේ සේවකයින් හට මෙම චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ රු5,339,402 ක් ආපදා ණය ලෙස ගෙවා තිබුණි.

(ඇ)	2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ ii ඡේදය	වැටුප් හා දීමනා පිළිබඳ තීරණය කිරීමේ බලය අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ලබාදී නොමැති අතර අමතර ගෙවීම් ලෙස සිදුකරනු ලබන සියළු දීමනා සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද, සමාගම විසින් 2017 වර්ෂයේදී හඳුන්වා දෙන ලද සුපෝෂ නිෂ්පාදනය සඳහා බඳවාගෙන තිබුණු අලෙවි කළමනාකරු හට රු.10,000 ක අමතර දීමනාවක් සුපෝෂ ගිණුමෙන් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියක් මත ගෙවා තිබුණු අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.120,000 ක් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය රහිතව ගෙවා තිබුණි.
(ඉ)	2019 ජනවාරි 12 දිනැති අංක DMA/1 – 2019 දරන කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 133 හා 134	සමාලෝචිත වර්ෂය තුළදී සිදු කරන ලද අභ්‍යන්තර විගණනයන්ට අදාළ වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(ඊ)	අංක DMS/E4/13/08/413/1 සහ 2013 මාර්තු 28 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30	සමාගම සඳහා අනුමත කර තිබුණු බඳවා ගැනීමේ පටිපාටි අනුව සියලුම සේවා ගණයන් සඳහා තනතුරෙහි ස්ථිර කිරීම, ශ්‍රේණි අතර උසස්වීම (III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට සහ II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට) සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග සහ අදාළ අවස්ථාවේ දී අදාළ මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය ලබාගත යුතු බව සඳහන් කර තිබුණද අනුමත වර්ෂයේ සිටම සියලුම සේවකයින් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග සහ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගැනීම සම්බන්ධයෙන් සමාගම කටයුතු කර නොතිබුණි. ඒ අනුව අදාළ පත්වීම් ස්ථිර කිරීම හා උසස් කිරීම් උක්ත සඳහන් පූර්ව අවශ්‍යතා කොන්දේසි ඉටුවීමකින් තොරව සිදු කර තිබුණි.
(උ)	2022 ජනවාරි 18 දිනැති අංක 02/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	දුරකතන දීමනා සඳහා හිමිකම් නොලබන සමාගමේ (JM 1-1) තෘතියික මට්ටමේ නිලධාරින් හට රු.1,000 ක දුරකතන දීමනාවක් 2019 මාර්තු 14 දින සිටද, MA 1-1 සහ MA 2-1 තනතුරුවල සේවය කරන නිලධාරින් 07 දෙනෙකු සඳහා 2019 ජූලි 15 දින සිටද ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත රු.1,000 ක මාසික දුරකතන දීමනාවක් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත ගෙවා තිබුණි.
(ඌ)	2022 ජනවාරි 14 දිනැති අංක 01/2015 (ii) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	ඉන්ධන දීමනාව ලබාදිය හැක්කේ HM වැටුප් කාණ්ඩයේ නිලධාරින් සඳහා පමණක් වුවද, ත්‍රිපෝෂ සමාගම විසින් MM වැටුප් තලයේ නිලධාරින් 05 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේදී එක් අයෙකුට රු.20,000 බැගින් ප්‍රවාහන දීමනාවක් ලෙස රු.1,200,000 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

(එ) 2016 ඔක්තෝබර් 21 දිනැති අංක 2016/02(I) දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය | සමාගමේ HM1-1 සේවා ගණය දරන ජොෂ්ඨ මට්ටමේ නිළධාරීන් දෙදෙනෙකු සඳහා අනුමැතියකින් තොරව 2020 වර්ෂයේ සිට HM1-2 සේවා ගණය යටතේ වැටුප් වර්ධක ලබාදී තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) යෝජිත සයිලෝ පද්ධතිය ඉදිකිරීම වෙනුවෙන් රු.192,091,525 ක් ලෝක ආහාර වැඩසටහන (WFP) මගින් 2021 වර්ෂය තුළදී ලබාදී තිබුණු අතර, එම මුදල් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි. 2023 ජනවාරි 02 දින වන විට එහි කල්පිරුණු අගය වූ රු. 207,815,400 ක මුදල ජනවාරි 20 දින මුදල් කරගෙන තිබුණු අතර මින් රු.125,000,000 ක මුදලක් 2023 ජනවාරි 27 දින නැවත ආයෝජනය කර තිබුණි. කෙසේ වුවත්, මෙම අරමුදල් සැපයූ අරමුණ ඉටු නොකර වෙනත් කාර්යයක් සඳහා මෙම අරමුදල් වැයකර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. එසේම මෙම මුදල සඳහා දින 18 ක කාලයක් සඳහා කිසිදු පොලී මුදලක් ලැබී නොතිබුණු අතර නැවත ආයෝජනය සඳහා තවත් දින 07 ක් ගතකර තිබුණි.

2.3 **වෙනත් කරුණු**

(අ) සමාගම විසින් රු.මිලියන 3,555.6ක් වූ අමුද්‍රව්‍ය පිරිවැය, රු.මිලියන 602.3ක් වූ සෘජු පිරිවැය හා රු.මිලියන 50.7ක් වූ වැටුප් ඇතුළු පරිපාලන වියදම් ත්‍රිපෝෂ හා සුපෝෂ නිෂ්පාදන ප්‍රතිශතය මත (සියයට 80 හා සියයට 20) බෙදාහැර තිබුණ අතර විකුණුම් හා බෙදාහැරීමේ වියදම් ත්‍රිපෝෂ හා සුපෝෂ නිෂ්පාදන අතර සියයට 49 හා 51 අනුපාතයටද,පරිපාලන වියදම් සියයට 92 හා 8 අනුපාතයටද,මූල්‍ය වියදම් සියයට 65 හා 35 අනුපාතයටද පිළිගත හැකි ක්‍රමවේදයකින් තොරව බෙදා හැර තිබීම හේතුවෙන් ත්‍රිපෝෂ නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම සඳහා අනුගමනය කර තිබූ ක්‍රමය තුලින් ත්‍රිපෝෂ නිෂ්පාදන පිරිවැයෙහි නිවැරදිතාවය ගණනයේදී තහවුරු නොවීය.

(ආ) 2022 වර්ෂයට අයත් ත්‍රිපෝෂ ආපසු හරවා එවුම් වෙනුවෙන් වූ රු. 11,701,601 ක් සෞඛ්‍ය අමාත්‍යාංශයට ගෙවිය යුතු බැව් හඳුනා ගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය තුළදීද අදාළ මුදල ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාගමෙහි සාංගමික ව්‍යවස්ථාවලියට අනුව ශ්‍රී ලංකාවේ මාතෘ හා ළදරු මන්දපෝෂණය අවම කරනු පිනිස ශ්‍රී ලංකාව විසින් බලගන්වනු ලබන අතිරේක ආහාර නිෂ්පාදනයන් සඳහා පහසුකම් සැලසීම හා වාර්ෂික ත්‍රිපෝෂ අවශ්‍යතාවය තක්සේරු කර ඒවා සැපයීමට අවශ්‍ය කටයුතු කිරීම සිදුකළ යුතු වේ. මෙම අවශ්‍යතාවය ඉටුකර ගැනීම සඳහා පවුල් සෞඛ්‍ය කාර්යාංශය මගින් ලබාදෙන දත්ත මත පදනම්ව වාර්ෂික ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා අවශ්‍ය වාර්ෂික නිෂ්පාදන සැලැස්මක් සකස් කළද එය සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතියට ඉදිරිපත් කර

අනුමත කරවාගෙන නොතිබුණි. කෙසේ වුවත් සකස් කරන ලද නිෂ්පාදන සැලැස්ම අනුව වාර්ෂික ප්‍රතිලාභීන් 795,036 ක් සඳහා ත්‍රිපෝෂ සැපයීම වෙනුවෙන් නඩත්තු හා නිවාඩු දින හැර දින 282 කදී නිෂ්පාදන කටයුතු ඉටු කිරීම සඳහා සැලසුම් සකස් කළද වර්ෂය තුළ සත්‍ය වශයෙන් නිෂ්පාදන කටයුතු කළ දින ගණන 211 ක් විය. ඒ අනුව මාසික ත්‍රිපෝෂ අවශ්‍යතාවයට අදාළව නිෂ්පාදන කටයුතු සම්පූර්ණයෙන් සිදු කර තිබුණු මාස ගණන 03ක් පමණක් විය. එසේම සමාගම පිළියෙල කරන ලද නිෂ්පාදන සැලසුම අනුව සුපෝෂ නිෂ්පාදනය හා කැලරි බිස්කට් නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ප්‍රමාණය සඳහන් කර නොතිබුණු බැවින් එම නිෂ්පාදන අවශ්‍යතා වෙනුවෙන් වූ අවශ්‍ය අමුද්‍රව්‍ය ප්‍රමාණය හඳුනාගත නොහැකි විය. ඒ අනුව ත්‍රිපෝෂ අවශ්‍යතාවයට ඇස්තමේන්තු කරන ලද අමුද්‍රව්‍ය සුපෝෂ හා කැලරි බිස්කට් වෙනුවෙන් යොදවා ගැනීම තුළින් සමාගමෙහි අපේක්ෂිත වූ අරමුණ ඉටුවී නොතිබුණි.

(ඇ) 2023 වර්ෂය තුළ සමාගම විසින් නිෂ්පාදනය කරන ලද සම්පූර්ණ නිමිද්‍රව්‍ය ප්‍රමාණය කිලෝග්‍රෑම් 9,163,067 ක් වූ අතර ඉන් සියයට 80 ක් හෙවත් කිලෝග්‍රෑම් 7,341,728 ක් පමණක් ත්‍රිපෝෂ නිෂ්පාදනය කර තිබුණු අතර ඉතිරි සියයට 20 ක් හෙවත් කිලෝග්‍රෑම් 1,821,339 ක් සුපෝෂ නිෂ්පාදනය කර තිබුණි. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සමාගම වෙත පවරා ඇති ප්‍රමුඛ කාර්යය වූ ත්‍රිපෝෂ නිෂ්පාදන ඉලක්කය සියය 62 ක් වැනි මට්ටමකින් සපුරා තිබියදී සමස්ථ නිෂ්පාදනයෙන් සියයට 20 ක් සුපෝෂ නිෂ්පාදනය කිරීම ආයතනය පිහිටුවීමේ මූලික අරමුණට අනුකූල නොවීමක් බව අනාවරණය විය.

(ඉ) සමාගම පිහිටුවීමේ ප්‍රධාන පරමාර්ථය වූ, ත්‍රිපෝෂ නිෂ්පාදනය කිරීමට වඩා සුපෝෂ නිෂ්පාදනය කිරීම කෙරෙහි සමාගම වැඩි පෙළඹවීමක් ඇති බවත් මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ සුපෝෂ නිෂ්පාදන අලෙවි ආදායම මත පදනම්ව ලාභයෙන් සියයට 5 සිට සියයට 10 දක්වා ඉලක්ක දීමනාවක් ගෙවීමට සමාගම කටයුතු කිරීම බව අනාවරණය විය. එසේම ඉලක්ක දීමනා සඳහා නිසි අනුමැතියක් හා ක්‍රමවේදයක් නොතිබුණි.

(ඊ) වාර්ෂික ත්‍රිපෝෂ අවශ්‍යතාවය සපුරාගැනීම සඳහා නිෂ්පාදනය වෙනුවෙන් අවශ්‍යවන සැලසුම්ගත අමුද්‍රව්‍ය වන බඩඉරිඟු, සෝයා, කිරි පිටි, විටමින් හා ඛනිජ නිෂ්පාදනය සඳහා යොදාගත හැකි ප්‍රමාණය පිළිවෙලින් මෙ.ටොන් 8927ක් 3862ක් 304ක් 09 ක් හා 90 ක් වශයෙන් වූ අතර සත්‍ය වශයෙන් වර්ෂය තුළ නිෂ්පාදනය වෙනුවෙන් නිකුත් කළ අමුද්‍රව්‍ය ප්‍රමාණය පිළිවෙලින් මෙ.ටොන් 7,179ක් 2,432ක් , 284ක් 08 ක් හා 84 ක් විය.ඒ අනුව වාර්ෂික ත්‍රිපෝෂ අවශ්‍යතාවය සපුරා ගැනීමට ප්‍රමාණවත් අමුද්‍රව්‍ය ප්‍රමාණයක් පරිත්‍යාග හා මිල දී ගැනීම් මඟින් ලැබී තිබුණ ද එම අවශ්‍යතාවය ඉටු කිරීමට කටයුතු කර නොතිබුණු අතර සුපෝෂ මෙ.ටොන් 1,822ක් නිෂ්පාදනය සඳහා මෙම අමුද්‍රව්‍ය අන්තර්ගතය යොදා ගැනීම මීට හේතුවී තිබුණු බවද අනාවරණය විය.

(උ) ත්‍රිපෝෂ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය අනුව අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය 07 දෙනෙකුගෙන් සමන්විත වන අතර එය අදාළ අංශ නියෝජනය වන පරිදි පත්කර ඇති බව නිරීක්ෂණය විය. එසේ වුවද සෞඛ්‍ය අමාත්‍යාංශය නියෝජනය කිරීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා පත්කර තිබුණද 2022 වර්ෂයේ පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 න් රැස්වීම් 8 කට ඔහු සහභාගි වී නොමැති බව

නිරීක්ෂණය වූ අතර 2023 වර්ෂයේ පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 10න් කිසිදු රැස්වීමකට ඔහු සහභාගී වී නොමැති බවද අනාවරණය විය.

(ඍ) අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් අනුව තැන්පතු පොළී ආදායම හා අපතය විකිණීමෙන් ලබන ආදායම පදනම් කර ගෙන සමාගමේ සේවකයින් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු. 15,390,730 ක දිරිදීමනාවක් ගෙවා තිබුණු අතර ත්‍රිපෝෂ නිෂ්පාදන ක්‍රියාවලියේදී ඇතිවන බැහැරවීම් මෙලෙස අපතය ලෙස විකුණන අතර, එම ලැබෙන මුදල් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත බැර කළ යුතු වුවත් මෙම දිරි දීමනාව ගෙවීම සඳහා භාවිතා කර තිබුණි. එසේම දිරිදීමනා ගෙවීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කර අනුමැතිය ලබාගෙන නොතිබුණි. පැමිණීම හා කාර්යසාධනය මත ලබාදෙන දීමනාවක් ලෙස මෙම දිරිදීමනාව නම් කළද පැමිණීම සම්බන්ධයෙන් පමණක් සලකා තිබුණු අතර, කාර්යසාධනය ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි. තවද, සමාගමේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිළධාරීන්ගේ පැමිණීම හා පිටවීම සම්බන්ධයෙන් සමාගමේ පවතින නීති, රීති අනුගමනය කර නොතිබුණු බැවින් පැමිණීම පදනම් කරගෙන සිදුකරන මෙම ගෙවීම්වල වලංගුතාවය සම්බන්ධයෙන් ගැටලු සහගත විය.

(එ) සේවක දිරිගැන්වීමක් වශයෙන් හා අනුමත කළ/නොකළ වැටුප් රහිත නිවාඩු ලබා නොගත් සේවකයින් 162 කට සමාගමේ සභාපතිවරයාගේ අනුමැතිය මත සමාලෝචිත වර්ෂයේදී වැටුප් වර්ධක දෙක බැගින් ගෙවා තිබුණි. ඒ අනුව මාසිකව රු.67,690 ක මුදලක් වැටුප් වර්ධක ලෙස වැඩිපුර ගෙවා තිබුණි. මෙම පූර්වාදර්ශය 2024 වැටුප් වර්ධක ලබාදීමේදීද අනුගමනය කරමින් මෙලෙස වැටුප් වර්ධක දෙක බැගින් ගෙවා තිබුණි.

(ඒ) අංක DMS/E4/13/08/413/1 දරන 2013 මාර්තු 28 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ ලිපිය ප්‍රකාරව සමාගම වෙනුවෙන් 2010 දෙසැම්බර් 02 දින අනුමත කළ සියලු තනතුරු සඳහා අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ විධිවිධාන පරිදි සකස් කරන ලද, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් නිර්දේශිත බඳවාගැනීම් පටිපාටිය අනුමත කර තිබුණ ද එදිනෙන් පසුව ඇති කරන ලද නව තනතුරු තුනක් සඳහා බඳවා ගැනීම් පටිපාටි සකස් කර අනුමත කරවාගෙන නොතිබුණි. එමෙන්ම අනුමත බඳවාගැනීම් පටිපාටියකින් තොරව ඇතැම් බඳවාගැනීම් ද සිදු කර තිබුණු බව අනාවරණය විය.

(ඔ) ද්විතිය මට්ටම යටතේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුරෙහි අනුමත නිළධාරීන් සංඛ්‍යාව 16 ක් වුවත් තථ්‍ය සේවත සංඛ්‍යාව 08 ක් වූයෙන් පුරප්පාඩු තනතුරු 08 ක් විය. එසේම තෘතික මට්ටමේ තනතුරක් වූ මුදල් නිළධාරී තනතුර 2021 අගෝස්තු 01 පුරප්පාඩු වී තිබුණි. මෙම පුප්පාඩු පිරවීමට හෝ එම තනතුරු තවදුරටත් අවශ්‍ය නොවන්නේ නම් තනතුරු අවලංගු කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඕ) සමාගම විසින් 2016 වර්ෂයේදී පරිපාලන රීති සංග්‍රහය සකස්කර අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණද, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය මෙතෙක් ලැබී නොතිබුණි. කෙසේ වුවත් සමාගම විසින් එහි අඩංගු ඇතැම් අනුමත නොවු නිතී,රීතී අනුගමනය කරන බව විගණනයේදී අනාවරණය විය.

(ක) වාහන සහ ඒවායේ උපකරණ පිළිබඳ සමීක්ෂණයක් සිදු කළ යුතු වුවත්, 2023 වර්ෂයට අදාළව සමාගම සතු වාහන සම්බන්ධයෙන් එකී සමීක්ෂණය සිදුකර අදාළ සමීක්ෂණ වාර්තාව විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

ත්‍රිපෝෂ
THRIPOSHA
திரிபோஷ

ත්‍රිපෝෂ නිවසින්
SUPOSHA சுபோஷா
සුපෝෂ